SLECIC

වාර්ෂික වාර්තාව -2024

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ජාත්‍යන්තර වෙළඳාම ආශ්‍රිත අවදානම් අවම කිරීම, අපනයනකරුවන්ගේ ආත්ම විශ්වාසය වැඩිදියුණු කිරීම, වෙළඳ මූල්‍යයනය වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම තුළින් මෙරට අපනයන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) විසින් ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. භූ දේශපාලනික පීඩනයන්, ආර්ථික අවහිරතා, සහ ණය අවිනිශ්චිතතා හේතුවෙන් ගෝලීය වෙළඳ ගතිකත්වයන් විශාල වශයෙන් විචලනය වෙමින් පවතින පසුබිමකදී, විදේශීය මෙවැනි සමාන ආයතන සමඟ සමීප සහයෝගිතාවයෙන් කටයුතු කරන සවිමත් අපනයන ණය නියෝජිතායතනයක් පැවතීම තිරසර අපනයන වර්ධනයක් සඳහා ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් වාණිජ අවදානම් (ගැනුම්කරුවන් බංකොලොත්බවට පත්වීම, දිගු කාලීන වශයෙන් ණය ගෙවීම් පැහැර හැරීම්, සහ ගිවිසුම් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම් වැනි) මෙන්ම දේශපාලනික අවදානම් (යුද්ධ, අපනයන සීමාකිරීම්, හිමිකම් පවරාගැනීම්, හෝ යම් විනිමය ඒකකයක් වෙනත් විනිමය ඒකකයකට මාරු කළ නොහැකිවීම ඇතුළුව) සම්බන්ධයෙන් පුළුල් ආවරණයක් සහිත අපනයනණය රක්ෂණ ලබා දෙනු ලැබේ. අපනයනවලින් ලැබිය යුතු ආදායම් සහතික කිරීම ඔස්සේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් අවදානම් සංජානනය අඩු කරන අතර, එමඟින් විශේෂයෙන් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ගෝලීය මට්ටමින් වඩාත් ඵලදායි ආකාරයෙන් තරඟ කිරීමේ හැකියාව ඇති කෙරේ.

ජාතික අපනයන උපාය මාර්ග සඳහා සහාය ලබාදීම පිණිස ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සිය රේඛීය අමාත්‍යාංශය වන මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමත්‍යාංශය සමඟ එක්ව රජය සහ වෙළඳ කටයුතු පිළිබඳ නියෝජිතායතන සමඟ සමීපව කටයුතු කරනු ලැබේ. ඉහළ අවස්ථාවන් පවතින නමුදු ඉහළ අවදානම් සහිත වෙළඳපොළවල් හඳුනාගැනීම, එක් එක් ක්ෂේත්‍ර සඳහා විශේෂ වූ අපනයන සංවර්ධන වැඩසටහන් සඳහා සහාය ලබාදීම, අගය එකතු කළ සහ සාම්ප්‍රදායික නොවන අපනයන දිරිමත් කිරීම, සහ වෙළඳාම පහසුකරණයේ ප්‍රතිපත්ති සහාය සඳහා දායකවීම ආදිය මෙහි දායකත්වයන් යටතට ඇතුළත් වේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව යනු හුදෙක් මූල්‍ය සවිබල කාරකයෙකු පමණක් නොව, ආර්ථික සංවර්ධනය සඳහා රුකුලක් වන උපායමාර්ගික ප්‍රතිපත්තිමය මෙවලමක් ද වේ.

තව ද, විදේශ රටවල රැකියා අපේක්ෂිතයන් සඳහා ගුවන් ගතවීමට පූර්වයෙන් ඔවුන්ගේ ප්‍රවාහන ගාස්තු ණය ආවරණය සඳහා බැංකු වෙත ලබාදෙන ඇපාරා (APARA) බැංකු ඇපකරය, අපනයන කාර්යසාධන ඇපකර (EPG), සැපයුම්දාම සේවා සහ අපනයන සේවා (මෘදුකාංග, ඉදිකිරීම් ආදිය) වැනි විවිධ අනෙකුත් ආකාර ඔස්සේ ද විදේශ විනිමය ඉපැයුම් වැඩිකර ගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සේවා සපයනු ලැබේ.

අන්තර්ගතය

- දැක්ම සහ මෙහෙවර - 07
- සභාපතිවරයාගේ සමාලෝචනය - 09
- වසර පහක කාර්ය සාධනය සැකෙවින් - 11

අප පිළිබඳව දැනුවත් වන්න

- අධ්‍යක්ෂ මණ්ඩලය - වර්තමාන සහ 2024 - 13
- ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය - 15
- මධ්‍යම කළමණාකාරිත්වය - 15
- නිමැවුම් සහ සේවා - 16
- කාර්ය සාධනය සැකෙවින් - 19
- ආයතනික යහපාලනය - 25
- විගණන කමිටු වාර්තාව - 26

මූල්‍ය වාර්තාව

- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - 31
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය - 33
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය - 34
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - 35
- මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - 36
- ගිණුම්කරණ ප්‍රතිපත්ති - 45

විගණකාධිපතිවරයාගේ වාර්තාව

- රජයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව

1978 අංක 15 දරන පනත

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) යනු 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ පනත යටතේ ස්ථාපනය කරන ලද ආයතනය වන අතර 1979 පෙබරවාරි 08 වැනි දින සිට එහි මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ණය සහ ආයෝජන රක්ෂණකරුවන්ගේ ජාත්‍යන්තර සංගමයේ (බර්න් සංගමය) සාමාජිකයෙකි.

අපගේ දැක්ම

ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමෙහිලා උත්ප්‍රේරකය වීම

අපගේ මෙහෙවර

අපනයනකරුවන්, බැංකු, අනෙකුත් මූල්‍ය ආයතන හා ආනයනකරුවන් වෙත තොරතුරු, සහාය හා ආරක්ෂාව සැපයීමේ ව්‍යාපාරික කාර්යයයේ අප විසින් නියැලී සිටින්නෙමු. පුද්ගල අවශ්‍යතානුකූලවම සැකසූ සේවා සැපයීමේ විශිෂ්ටත්වය සඳහා අප විසින් ප්‍රයත්න දරනු ලැබේ.

සභාපතිවරයාගේ සමාලෝචනය

2024 මූල්‍ය වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මා විසින් ඉදිරිපත් කරනුයේ ඉමහත් සාඩම්බරයෙන් සහ තෘප්තිමත් හැඟීමෙනි. මෙම වර්ෂයේ දී, දිගු කාලීන අවශ්‍යතාවයක් වශයෙන් පැවති අපගේ සංවිධානය ව්‍යුහය සවිමත් කරගැනීමේ ගැටලුව සඳහා ක්‍රමෝපායික වශයෙන් දියත් කළ කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමඟින්ම මෙම ආයතනයේ ඉතිහාසය තුළ මෙතෙක් වාර්තා වූ ඉහළතම මෙහෙයුම් ආදායම වාර්තා කරමින් අප විසින් ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. මෑත කාලීනව සහ ඉදිරි වර්ෂ ද සැලකූවිට ගෝලීය ආර්ථිකයේ වඩාත්ම අභියෝගාත්මක පීඩන තත්ත්වයකට මුහුණ දෙමින් වුව ද, ජාත්‍යන්තර වෙළඳ කටයුතු සඳහා සහාය හා පහසුකම් සැලසීම පිණිස මෙම ජයග්‍රහණ ඔස්සේ අපගේ ධාරිතාවයන් සුවිශේෂී අයුරින් වැඩි දියුණු විය.

යුක්රේනයේ යුද්ධමය වාතාවරණය හේතුවෙන් යුරෝපය තුළ දැනට ද පවතින ආර්ථික පසුබෑම, ගාසා තීරයේ අර්බුදය, සහ රතු මුහුදේ භාණ්ඩ ප්‍රවාහන නෞකා ආශ්‍රිතව පවතින ගැටලුව ආදී වශයෙන් ගෝලීය වෙළඳ කටයුතු සඳහා සුවිශේෂී ආකාරයෙන් බලපෑමක් ඇතිකරන සියලු සාධක ඇතුළුව ගෝලීය අවහිරතා සැලකිය යුතු සංඛ්‍යාවක් ඇති වූ මෙම සමාලෝචිත වර්ෂයේ සංදර්භය තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් ලබාදෙන සේවා ඉතා වැදගත් වේ. භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම සහ නැව් ගමනාගමන කාල සීමා දීර්ඝ වීම මෙමඟින් ප්‍රතිඵල වූ අතර, ඒ හේතුවෙන් මෙරට තුළ පැවති අසීරු ආර්ථික තත්ත්වය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් තවදුරටත් පීඩනයට පත්විණි.

අසීරුතා මධ්‍යයේ අපනයනකරුවන් සඳහා සහාය ලබාදීම

මෙම කැලඹුණු තත්ත්වයන් මධ්‍යයේ අපනයනකරුවන් විසින් සැපයුම් දාම බිඳ වැටීමේ සිට විචල්‍ය ජාත්‍යන්තර ඉල්ලුම දක්වා වූ පුළුල් පරාසයක අභියෝගවලට මුහුණ දෙන ලදී. මීට ප්‍රතිචාරාත්මක වශයෙන්, නම්‍යශීලි, එක් එක් අපනයනකරුවන්ගේ අවශ්‍යතානුකූලව සකස් වූ රක්ෂණ විසඳුම් ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සිය සහාය ලබාදීම වැඩිකරන ලදී. වෙළඳ ණය රක්ෂණ, දේශපාලනික අවදානම් ආවරණය, හෝ පූර්ව නැව්ගත කිරීම් හෝ පශ්චාත් නැව්ගත කිරීම් ඇපකර හරහා මූල්‍යයන පහසුකම් වෙත ප්‍රවේශය සැලසීම පිණිස පහසුකම් සැලසීම හෝ වේවා අපගේ සේවාදායකයන් සඳහා නිරතුරුවම ස්ථිර සහකරුවෙකු වශයෙන් අප විසින් කටයුතු කරන ලදී.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ මුදල් ඒකකය වන රුපියල අධිප්‍රමාණය වීමෙන් ඉදිරියට ඉටුකිරීමට නියමිතව තිබූ සියලු ඇණවුම් හරහා අපනයනකරුවන්ගේ ආදායම් කෙරෙහි අහිතකර අයුරින් බලපෑමක් ඇති කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ වාරික රැස්කිරීම කෙරෙහි ද බලපෑමක් ඇති විය. විනිමය ඒකකයේ වෙනස්වීම හේතුවෙන් 2023 වර්ෂයේ ඇති වූ රු. මිලියන 294.01ක විනිමය පාඩුවට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු. මිලියන 259.26 ක විනිමය පාඩුවක් ප්‍රතිඵල විය.

මෙවැනි දුෂ්කරතා පැවතිය ද, අපගේ ප්‍රධාන මෙහෙවරෙහි අඛණ්ඩව නිරත වෙන ලදී: එනම් ණය කොන්දේසි මත පවතින නැව් භාණ්ඩ ප්‍රවාහනය සඳහා පරිපූර්ණ අවදානම් කළමනාකරණ විසඳුම් ඔස්සේ ශ්‍රී ලංකාවේ අපනයනයන් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සිදු කිරීම යි.

ඔරොත්තු දීමේ හැකියාව සනාථ කෙරෙන මූල්‍ය කාර්ය සාධනය

නිරන්තරයෙන් වෙනස්වන සුළු මෙහෙයුම් පරිසරයක් හමුවේ වුව ද, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සිය මූල්‍ය ශක්තිය පවත්නා ගෙන යන ලදී. විචක්ෂණශීලි අභ්‍යන්තර අවදානම් කළමනාකරණය, ක්‍රමෝපායික ආයෝජන, සහ විනයගත සංසක්ත මෙහෙයුම් ප්‍රවේශය ඔස්සේ ආයතනයේ වසර 45 ක් වූ ඉතිහාසය තුළ රු. මිලියන 604.23 ක ඉහළතම ශුද්ධ මෙහෙයුම් ආදායම සමාලෝචිත වර්ෂයේ දී වාර්තා කිරීමට අප සමත් විය.

ක්‍රියාත්මක වපසරිය පුළුල් කිරීම: විදේශ රැකියා වෙළඳපොළ

ශ්‍රී ලාංකිකයන් තුළ විදේශගත රැකියා අවස්ථා අපේක්ෂාවෙන් පසුවීමේ ඉහළ යන ප්‍රවණතාවය තුළ අප ආයතනය මගින් රැකියා සඳහා විදෙස්ගත වන ශ්‍රී ලාංකිකයන් සඳහා ගුවන් ගතවීමට පූර්වයෙන් ලබාදෙන ණය ආවරණය සඳහා බැංකු වෙත ලබාදෙන "ඇපාරා" බැංකු ඇපකරය හරහා ඔවුන් වෙත පහසුකම් සැලසීමේ අවස්ථාවක් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව වෙත උදාකර තිබේ. මෙම පිරිස් වෙත ලබාදෙන මෙම සුවිශේෂී සහාය හරහා අප වෙත 2024 වර්ෂයේ දී රු. මිලියන 234.39 ක ඉහළ ආදායමක් හිමිවී තිබේ. මෙය පූර්ව වර්ෂයේ ලැබී ඇති රු.මිලියන 79.99 ක ආදායම සමඟ සංසන්දනය කිරීමේ දී 193% ක සුවිශේෂී ඉහළ යෑමකි.

මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම

විශේෂයෙන් මෙහෙයුම්, හිමිකම් සහ අලෙවි කටයුතු ද ඇතුළුව සංස්ථාවේ ප්‍රධාන තනතුරු සමඟින් ස්ථිරව පැවති පුරප්පාඩු 15ක් සඳහා 2024 වර්ෂයේ දී බඳවාගැනීම් සිදුකරන ලදී.

කණ්ඩායම් හැඟීම සහ ධනාත්මක වැඩ පරිසරයක් වැඩිදියුණු කිරීම සඳහා, වාර්ෂික විනෝද චාරිකාවක් සහ සංස්ථාවේ 4 5 වැනි සංවත්සරය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වයෙන් පැවති විශේෂ සැමරුම් දිවා භෝජනය ද ඇතුළුව සාම්ප්‍රදායික වශයෙන් කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් සිදුකරන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදුකරන ලදී.

ඩිජිටල් පරිවර්තනය සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්

රටෙහි ආර්ථික ප්‍රගතිය වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනය ඉතා වැදගත් වේ. 2048 වර්ෂය වනවිට ඉහළ ආදායම් උත්පාදනයක් සහිත ආර්ථිකයක් නිර්මාණය කිරීම පිණිස ජාතික ඩිජිටල් ආර්ථික ක්‍රමෝපායක අවශ්‍යතාවය රජය විසින් හඳුනාගෙන තිබේ. ප්‍රධාන පාර්ශවකරුවෙකු වශයෙන් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ දී අපනයනකරුවන්, සංක්‍රමණික සේවකයන්, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන වෙත ලබාදෙන සේවා ඉහළ නංවමින් සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් ඩිජිටල් ආකාරයට පරිවර්තනය කිරීම සඳහා පියවර ගෙන ඇති අතර එමඟින් එකී සේවාදායකයන් වෙත සවිමත් මාර්ගගත පද්ධතියක් වෙත ප්‍රවේශය ඇතිකරනු ලැබේ.

තවද, නවතම සංවර්ධන මෙවලම් සහ ආරක්ෂණ තාක්ෂණයන් යොදා ගනිමින් නව පද්ධති ස්ථාපිත කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සඳහා සංස්ථාව විසින් දැනටමත් පියවර ගෙන තිබේ. එකී වැඩිදියුණු කිරීම්වලට අනුව, හාඩ්වෙයා ෆයර්වෝල්, හසුරුවාලිය හැකි ස්විච් සහ අවසන් පරිශීලක පරිගණක වැඩිදියුණු කිරීම මගින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා සංස්ථාව විසින් සැලසුම් කරමින් පවතී.

මෙම කටයුතුවල අවසාන ඉලක්කය වශයෙන් රජයේ සේවාවලට ඩිජිටල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට නිර්මාණය කළ "GovPay" මාර්ගගත ගෙවීම් පද්ධතිය සමඟ සම්බන්ධ වීමට සංස්ථාව විසින් සැලසුම් කරමින් සිටී. අපගේ සියලුම හවුල්කරුවන්ට වඩාත් සුරක්ෂිතව සහ පහසුවෙන් ගනුදෙනු කිරීමට මෙමගින් හැකිවනු ඇත.

අලෙවිකරණ සහ සංස්ථාවේ සේවා ප්‍රජාව වෙත සමීප කරලීමේ මූලාරම්භයන්

ක්‍රමෝපායික හවුල්කාරිත්වයන්, නව්‍ය නිමැවුම් ඉදිරිපත් කිරීම, පූර්ව ක්‍රියාකාරී අවදානම් අවම කිරීම් ඔස්සේ අපනයන ක්ෂේත්‍රය සවිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව කැපවී සිටී. අප විසින් මෙම වර්ෂය තුළ දී අත්පත් කරගත් සැලකිය යුතු ජයග්‍රහණයන් වනුයේ:

- සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායික අපනයනකරුවන් සඳහා ප්‍රාදේශික වශයෙන් පවතින අවස්ථා ප්‍රවර්ධනය කිරීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සක් කරන ලදී.
- ජාත්‍යන්තර ප්‍රදර්ශනයක් සඳහා ඉලෙක්ට්‍රික් වාහනයක් ඉන්දියාවට රැගෙන යෑමට අදාළව, යම් නිශ්චිත කාල සීමාවක් සඳහා බදු රහිතව තාවකාලිකව භාණ්ඩ අපනයනය සඳහා අවසර ලබාදෙන ජාත්‍යන්තර රේගු ලේඛනයක් වන ATA Carnet ඇපකරකයක් නිකුත් කිරීම - නවෝත්පාදන වැඩිදියුණු කිරීම සඳහා අපගේ කැපවීම සමඟින් නිමැවුම්වල පරාසය පුළුල් කිරීම.
- වඩාත් වැදගත් සැපයුම්දාම අංශය සඳහා විසඳුම් ලබාදෙමින් නැව් කටයුතු සහ භාණ්ඩ සේවා කටයුතුවල නිරතවන්නන් ඉලක්ක කරගෙන අපනයන කාර්යසාධන ඇපකර ක්‍රමය නැවත ක්‍රියාත්මක කිරීම.
- අපනයන කර්මාන්ත ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් සමඟ පවතින සම්බන්ධතාවය වෙර නංවමින් අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය සමඟ ඇතිකර ගෙන තිබූ ක්‍රමෝපායික හවුල්කාරිත්වය යළි පණ ගන්වන ලදී.
- මීට අමතරව, "ඇපාරා" බැංකු ඇපකරය යටතේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් ප්‍රථම වරට සිය ඩිජිටල් වෙළඳ ප්‍රචාරණ මෙහෙයුම දියත් කරන ලද අතර එමගින් දැනුවත්බව ඇතිකිරීම හා සංස්ථාවේ සේවාවන් ප්‍රජාවට සමීප කරලීම හා එහි දැකිය හැකිබව වැඩිදියුණු කෙරේ.

ඔප්පු සහ ඇපකර පිළිබඳ අත්පොත්

සංස්ථාව විසින් පිරිනමන සේවා වැඩිදියුණු වෘත්තීයභාවයකින් යුතුව ලබාදීම පිණිස ඇපකර ප්‍රතිරක්ෂණය සහ ඇපකර හිමිකම් පිළිබඳ අත්පොත් සම්බන්ධයෙන් බොහෝ කලක සිට පැවති අපේක්ෂාව ඉටු කරමින් එම කටයුතු සිදුකිරීම මෙන්ම දැනට පවතින ගැනුම්කරුවන් ප්‍රතිරක්ෂණය සහ හිමිකම් ප්‍රතිලාභ අත්පොත් යාවත්කාලීන කිරීම සඳහා කටයුතු සංස්ථාව විසින් ආරම්භ කරන ලදී.

ඉදිරි කටයුතු

ආර්ථික සංවර්ධනය යනු ශ්‍රී ලංකා රජයේ ඉතා කඩිනම් ප්‍රමුඛතාවලින් එකකි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති රාමුව මගින් ඉදිරිපත් කර ඇති නව රජයේ ආර්ථික උපායමාර්ගය තුළ වෙළඳපොළ ආර්ථිකයේ මූලධර්ම මත පදනම් ආර්ථික වර්ධනය සඳහා නව ප්‍රවේශයක් ඇතුළත් වේ. නව ගෝලීය ආර්ථික සංදර්භය තුළ ඵලදායිතාවයේ සහ ආර්ථික වර්ධනයේ ගාමක බලවේගයක් ලෙස කුසලතා මත පදනම් තාක්ෂණය සඳහා පහසුකම් සැලසීමට නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

2030 වර්ෂය වන විට ඇ. ඩො. බිලියන 40ක අපනයන ආදායමක් උපයාගැනීමට හැකියාවැති පරිසරයක් නිර්මාණය කිරීම පිණිස වන ප්‍රතිපත්ති හඳුනාගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට නව රජය විසින් අවධානය යොමුකර තිබේ. ප්‍රධාන ආර්ථික ඉලක්ක ජයග්‍රහණය කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස අවශ්‍ය මඟ පෙන්වීම ලබාදීමට ජාතික අපනයන ක්‍රමෝපාය (NES) මගින් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ අපනයන දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා වූ සංසක්ත ඉදිරි සැලැස්ම තුළට ජාතික මට්ටමින් අනාවරණය වී ඇති කරුණු සහ ප්‍රමුඛතා ජාතික අපනයන ක්‍රමෝපාය මගින් ඒකාබද්ධ කෙරේ. ක්‍රමෝපායික අරමුණු හතරක් ඔස්සේ මෙම දැක්ම සඳහා මඟ පෙන්වීම ලබාදෙන අතර එකී අරමුණු වනුයේ: පුරෝකතනය කළ හැකි සහ විනිවිදභාවයකින් යුතු ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක් නිර්මාණය කිරීම, නවෝත්පාදන ඔස්සේ අපනයන විවිධාංගිකරණය සිදුකිරීම, වෙළඳපොළ ප්‍රවේශය හා අනුකූලතාවය පිළිබඳ ධාරිතාවයන් වැඩිදියුණු කිරීම ඔස්සේ නැඟීඑන වෙළඳපොළ අංශ සවිමත් කිරීම, සහ කාර්යක්ෂම වෙළඳ හා සැපයුම්දාම කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම යි.

අප විසින් සපයනු ලබන සේවා වලට අමතරව, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අපගේ භූමිකාව වනුයේ වැඩිපුර තොග රඳවාගැනීම, දරා ගත හැකි ධාරිතාවයට වඩා අලෙවි කිරීම, ණය, පාඩු, මූල්‍ය වාර්තාවල ප්‍රමාදය, ගැනුම්කරුවන්ගේ හැසිරීමේ වෙනස්කම්වලට අදාළ අවදානම් දර්ශක ඇතුළුව අපනයන ක්ෂේත්‍රය හා බැඳී පවතින අවදානම් පිළිබඳ කලින් හඳුනාගැනීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් වීමට අපනයනකරුවන් වෙත සහාය ලබාදීම බව අප විසින් හඳුනාගෙන තිබේ. බාධාවලට ලක් වූ වෙළඳ කටයුතුවලින් ප්‍රතිඵල වන හානිය අවම කරගැනීම සඳහා අවදානම පැහැදිලිව දක්නා අවස්ථාවේදී ම කඩිනමින් ඊට ප්‍රතිචාර දැක්වීම සහ නැවත එකඟතාවලට පැමිණීමේ, නැවත ගෙවීම් සැලසුම් හෝ වැඩිදුර හානි වැළැක්වීම සඳහා කාලෝචිත පරිදි මැදිහත්වීම් සිදුකිරීම අවශ්‍ය බව අපනයනකරුවන් වෙත නැවත නැවත අවධාරණය කිරීම අප විසින් අඛණ්ඩව සිදුකරනු ලැබේ.

ඉදිරි වර්ෂවල දී ධාරිතා සංවර්ධනය, වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීම සහ අවස්ථා නිර්මාණය කරගැනීම මගින් වැඩිවන අපනයන ආදායම් ඔස්සේ ආර්ථික වර්ධනය ප්‍රමුඛතාවයෙහිලා පවතින වඩාත් යහපත් හෙට දිනක් ශ්‍රී ලංකාව වෙත සාක්ෂාත් කරගැනීම සඳහා අප සැවොම එක්ව කටයුතු කරමු.

තුති පිදුම

සමාප්තිය සනිටුහන් කිරීමේ දී, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, අපගේ අගනා සේවක මණ්ඩලය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යන භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවලට, සහ විශේෂයෙන්ම අපගේ පාරිභෝගිකයන් වෙත මාගේ හදපිරි කෘතඥතාවය පිරි නමමි. ඔබ විසින් අප කෙරෙහි තැබූ විශ්වාසය හා අඛණ්ඩ සහයෝගය අපගේ අභිවෘද්ධිය සඳහා උපකාරී විය. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ ගමන්මඟෙහි නව පරිච්ඡේදයකට පිවිසෙන මෙම අවස්ථාවේ දී, අපි සැවොම සමඟියෙන්, අරමුණුගතව හා විශිෂ්ටත්වය සඳහා වූ හවුල් දැක්ම සහිතව ඉදිරියට පියවර තබමු.

මහාචාර්ය (ආචාර්ය) ඒ.අරුණ ශාන්තආරච්චි
B.A,PGD,MSc,MSSc,PhD
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ

වසර පහක තොරතුරු සැකෙවින්

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කාර්ය සාධන විග්‍රහය

2020 - 2024 (රු.මිලියනවලින්)

විස්තරය	2020	2021	2022	2023	2024
රක්ෂිත ව්‍යාපාර	37,107.76	49,298.69	70,002.35	55,545.76	58,305.87
දළ රක්ෂණ වාරික ආදායම	204.00	261.00	436.00	418.00	587.10
මෙහෙයුම් වියදම්	177.00	233.00	170.00	165.00	250.40
මෙහෙයුම් අතිරික්තය/(පාඩුව)	288.00	334.00	1,889.00	1,055.00	851.90
ආයෝජන ආදායම	215.00	209.00	528.00	787.00	498.20
ශුද්ධ අතිරික්තය/(පාඩුව)	223.00	249.00	1,643.00	480.00	322.60
ප්‍රාග්ධනය හා සංචිත	2,826.00	3,073.00	4,660.00	4,365.00	4,790.70
බදු හා අයබදු	90.00	111.00	309.00	281.00	270.00

















වාරික ආදායම

වාරික ගෙවීම් අනුපාතික ව්‍යුහය පදනම් වනුයේ ලාභ ද නොමැති පාඩු ද නොමැති යන මත ය. වෙළඳ කටයුතු සිදුවන ප්‍රධාන වෙළඳපොළවල්හි සීඝ්‍රයෙන් දුර්වල වෙමින් පවතින ව්‍යාපාරික වාතාවරණය හමුවේ වුව ද, අසීරු ආර්ථික කාල පරිච්ඡේදයක් තුළ සිය සේවාදායකයන් වන දේශීය අපනයනකරුවන්ට තරඟකාරී ආකාරයෙන් පැවතීම සඳහා සහායක් වීමේ අරමුණින් සංස්ථාව විසින් රටවල් කාණ්ඩකරණයේ දී එකම වර්ගීකරණයක් අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. එසේ වුව ද, score card based model ලෙස හැඳින්වෙන ආකෘතිය යොදා ගෙන පසුගිය වසර දෙක මුළුල්ලේම විකුණුම්කරුගේ රක්ෂණ වගකීම භාරගැනීමේ අවදානම් තක්සේරුව ශක්තිමත් කරන ලදී. පසුගිය වර්ෂයේ අනුරූපී අගය වන රු. මිලියන 411.93ට සාපේක්ෂව සංස්ථාව විසින් 2024 වර්ෂයේ දී වාරික ආදායම වශයෙන් රු.මිලියන 594.9ක් උපයා ගෙන තිබේ.

මුළු ආදායම

වාරික ආදායම, අනෙකුත් මෙහෙයුම් ආදායම් හා ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම්වලින් මුළු ආදායම සමන්විත වන අතර, 2023 වර්ෂයේ මුළු ආදායම වූ රු. මිලියන 1,220.88ට සාපේක්ෂව 2024 වර්ෂයේ මුළු ආදායම රු.මිලියන 1,102.45කි

මුළු වියදම

සෘජු වියදම් හා අනෙකුත් කළමනාකරණ වියදම්වලින් මුළු වියදම සමන්විත වේ. සෘජු වියදම්වල අන්තර්ගත වනුයේ හිමිකම් වියදම් හා තත්ත්ව වාර්තා පිරිවැය වන අතර අනෙකුත් වියදම් වනුයේ ආයතනික වියදම්, පරිපාලන වියදම්, විකුණුම් සහ අලෙවි පිරිවැය සහ මූල්‍ය ගාස්තු වේ. 2023 වර්ෂයේ වාර්තා වූ රු.මිලියන 165.26ට සාපේක්ෂව 2024 වර්ෂය සඳහා මුළු වියදම රු.මිලියන 250.46 ක් විය.

රාජ්‍ය ආදායම සඳහා දායකත්වය

සිය පැවැත්ම සඳහා භාණ්ඩාගාරයෙන් සැපයෙන මුදල් මත යැපෙන බවට රාජ්‍ය සංස්ථා වෙත විවේචන එල්ල වෙන පරිසරයක, පොදු ජනතාව සඳහා සුවිසල් පීඩනයක් වීමේ මූලාශ්‍රයක් වීමකින් තොරව වගකීම් සහගත රජය සතු ව්‍යවසායක් වශයෙන් භාණ්ඩාගාරය වෙත පීඩනයක් ඇති නොකරමින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් අඛණ්ඩව රජයේ ආදායම සඳහා දායකත්වය දැරීම සිදුවේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් රජය සතු ව්‍යවසායන් (S O E) සඳහා 2021 නොවැම්බර් මස නිකුත් කළ මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොත ප්‍රකාරව, රජය සතු ව්‍යවසායන් විසින් ආයෝජන මත සැලකිය යුතු ප්‍රතිලාභ ජනනය කිරීමත්, අතිරික්තයේ හෝ ලාභයෙන් කොටසක් බදු හෝ ලාභාංශ වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලට/ කොටස් හිමියන් වෙත ලබාදීමත් අපේක්ෂා කෙරේ. සමාලෝචිත වර්ෂය තුළ දී, මෙම අවශ්‍යතාවය සඳහා සංස්ථාව විසින් රු. මිලියන 265 ක දායකත්වයක් ලබා දී ඇත.

වසර ගණනාවක් තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සිය ඉපැයීම්වලින් අනාගත වගකීම් දැරීම සඳහා ප්‍රමාණවත් අරමුදලක් ගොඩනගා ගත යුතු අතර, එකී අරමුණට පහසුකම් සැලසීමේ අභිප්‍රායෙන් එවකට සිටි ව්‍යවස්ථාදායකයන් විසින් මෙම සංස්ථාව රජය වෙත විවිධ බදු වර්ග ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලදී. එසේ වුව ද, බදු අධිකාරීන් විසින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව අපනයන කටයුතු සඳහා සහාය ලබාදෙන නියෝජිතායතනයක් ලෙස නොසලකන ලදී. එබැවින් සංස්ථාව විසින් අඛණ්ඩව රජයේ විවිධ බදු වලට අදාළව ගෙවීම් කරනු ලැබේ.



අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ

ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ සිට මධ්‍යම පරිසර අධිකාරිය, මුදල් අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය දක්වා වූ පරාසයක සේවාදායකයන් සමඟ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් වසර 30කට අධික වෘත්තීය පලපුරුද්දක් සතු මහාචාර්ය (ආචාර්ය) අරුණ ශාන්තආරච්චි මහතා ආර්ථික විද්‍යාඥයෙකු සහ පර්යේෂකයකි. ආර්ථික සහ මූල්‍ය විශ්ලේෂණය, ආර්ථික, සමාජයීය සහ පාරිසරික බලපෑම් තක්සේරුව සමඟින් ව්‍යාපෘති ඇගයීම මොහුගේ අවධානිත ක්ෂේත්‍රයට ඇතුළත් වන අතර ආයතනික හා සංවර්ධන ගැටලු සම්බන්ධයෙන් ද දැනුම සතු ය. ව්‍යාපාර ආර්ථිකය පිළිබඳ දර්ශන ශූරී උපාධියක් හිමි මොහුට ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති සහ දර්ශනපති උපාධියක් ද සතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 35කට වැඩි සේවා කාලයකට හිමිකම් සතු ප්‍රියන්ත පෙරේරා මහතා සාමාන්‍ය රක්ෂණ කටයුතු පිළිබඳ අංශයේ දිගු කාලයක් නිරතව සිටින වෘත්තිකයෙකු වේ. 1985 වර්ෂයේ දී මර්කන්ටයිල් ක්‍රෙඩිට් ලිමිටඩ් ආයතනයේ රක්ෂණ අංශය තුළින් සිය රැකියාව ආරම්භ කළ මොහු මෙම අංශයේ විවිධ ආයතනවල වගකිවයුතු තනතුරු රාශියක් දරා තිබේ. මොහුගේ ආදර්ශමත් වෘත්තීය කාල සීමාව තුළ, ප්‍රතිරක්ෂණ කටයුතු, හිමිකම්, නැවත රක්ෂණය සහ රක්ෂණ කළඹ කළමනාකරණය වැනි අංශ ආවරණය කරමින් විවිධ කළමනාකරණ තනතුරු හොබවා තිබෙන අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවයට එක්වීමට පෙර ෆෙයා ෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගමේ ප්‍රධාන තාක්ෂණික නිලධාරී ලෙස කටයුතු කරන ලද අතර වර්තමානයේ දී ප්‍රධාන නිලධාරී - සාමාන්‍ය රක්ෂණය යන තනතුර හොබවයි. මොහු වරලත් රක්ෂණකරුවෙකු වන අතර එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය දරයි. එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ආචාර්ය සී.අමරසේකර මහතා වර්තමානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ධූරයක් හොබවමින් එහි ආර්ථික පර්යේෂණ, සංඛ්‍යාන හා වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තු අධීක්ෂණය කරනු ලබන අතර, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් ද කටයුතු කරනු ලැබේ. මොහු මීට පෙර ඇ.එ.ජනපදයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංග්ලාදේශය සහ භූතානය නියෝජනය කරන විකල්ප විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කිරීමට මහ බැංකුවේ සේවයෙන් මුදාහැර ඇත (2022 ජනවාරි-2024 පෙබරවාරි දක්වා).

ආචාර්ය අමරසේකර මහතා මහ බැංකුවේ වසර 22 කට අධික කාලයක් සේවය කර ඇති අතර, මුදල් ප්‍රතිපත්තිය සහ පර්යේෂණ පිළිබඳ විශේෂඥ දැනුමක් ලබමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු හොබවන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජකාරි සඳහා මුදාහැරීමට පූර්වයෙන් මොහු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේඅධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන ලදී. මොහු දැනට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරනු ලැබේ. මොහු මීට පෙර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ලදී.

මුදල් ප්‍රතිපත්තිය පිළිබඳව සහ මහ බැංකුවේ විෂය පථයට අදාළ විවිධ තේමා ඔස්සේ ආචාර්ය අමරසේකර මහතා විසින් සිදුකළ පර්යේෂණ ජාත්‍යන්තර සහ දේශීය සඟරා කිහිපයකම පළ කරන ලද අතර, ඒවා මහත් පිළිගැනීමට සහ වෙනත් පර්යේෂණවල ද ආශ්‍රය ග්‍රන්ථ අතරට ඇතුළත් විය. 2015-2020 කාල සීමාව තුළ මොහු මහ බැංකුවේ මාණ්ඩලික පත්‍රිකා මාලාවේ සහ මහ බැංකු සඟරාවේ සංස්කාරක වශයෙන් ද කටයුතු කරන ලදී. මොහු විවිධ විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, මහ බැංකුවේ බැංකු විද්‍යා පියස, බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය ඇතුළුව විවිධ අධ්‍යාපන සහ වෘත්තීය ආයතන සඳහා ආරාධිත දේශකයෙකු, විභාග පරීක්ෂකවරයෙකු, සහ ප්‍රශ්න විචාරකයෙකු වශයෙන් ද ස්වේච්ඡාවෙන් කටයුතු කරනු ලැබේ. එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනශූරී උපාධිය ද, එම විශ්වවිද්‍යාලයෙන්ම ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ද මොහුට හිමිය. මොහු නීතිඥවරයෙකු ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

කුලෝජා ගමින්දි පීරිස් මෙය ශ්‍රී ලංකා සැලසුම් සේවයේ නිලධාරිනියක් වන අතර දැනට මුදල් අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් ලෙස සේවයේ නිරත වේ. 2009 වර්ෂයේ දී සහකාර අධ්‍යක්ෂවරියක ලෙස බස්නාහිර පළාත් සභාවෙන් රාජ්‍ය සේවයට පිවිසි මැය දැනට වසර 15ක් පමණ කාලයක් රාජ්‍ය සේවයේ නිරත වේ. සිය සේවා කාලයේ දී, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ද සේවය කර ඇත. මීට අමතරව, රට තුළ ප්‍රතිපත්ති ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා සිය සේවය හා දායකත්වය ලබා දී ඇති මෙම නිලධාරිනිය ව්‍යවස්ථාපිත ආයතන කිහිපයක භාණ්ඩාගාර නියෝජිත ලෙස අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කර තිබේ. පීරිස් මෙය පශ්චාත් උපාධි දෙකක් හදාරා ඇත: ජපානයේ සුකුබා විශ්වවිද්‍යාලයේ රාජ්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධිය හා කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය. මැය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා ගෞරව උපාධිය සමත්වී ඇත. ඕස්ට්‍රේලියාව, ජපානය, චීනය, සිංගප්පූරුව සහ දකුණු කොරියාව වැනි රටවල්වල පැවති පුහුණු සඳහා සහභාගී වී ලබාගත් අත්දැකීම් ද මැය සතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

අබේසිංහ මහතා විශේෂයෙන් වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විෂය ක්ෂේත්‍රවලට අදාළව සැලසුම්කරණය හා සංවර්ධනය පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත රාජ්‍ය අංශයේ මනා නිපුණත්වයකින් හෙබි වෘත්තිකයෙකි. මොහු 2022 මැයි මාසයේ සිට වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) ලෙස කටයුතු කරනු ලැබේ. කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමි මොහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් විශිෂ්ට සම්මානයක් සහිතව උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබාගෙන ඇත. මොහු සිය අධ්‍යාපන චාරිකාව ආරම්භ කර ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය දෙවනපෙළ ඉහළ සාමාර්ථයක් සමඟ සමත් වෙමිනි.

අධ්‍යක්ෂ මණ්ඩලය - 2024

සෙනරත් දේවේන්ද්‍ර මහතා
හිටපු සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ

බහුජාතික, ජාත්‍යන්තර සහ ප්‍රධාන බහුවිධ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස වසර 35කට අධික පලපුරුද්දක් සහිත මොහු වරලත් සහ කළමනාකරණ ගණකාධිකාරී ආයතනවල සාමාජිකයෙකු වේ. අයිබීඑම් ආයතනයෙන් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ එච්එස්බීසී වෙතින් දේශසීමා මායිම් ඔස්සේ භාණ්ඩාගාර කළමනාකරණය සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් පුහුණුවක් ලබාගෙන තිබේ. මීට අමතරව, මූල්‍ය විශේෂඥයෙකු වශයෙන් සහ ජාත්‍යන්තර අලෙවිකරණය පිළිබඳ අත්දැකීම් ද සහිත මොහු බහුවිධ විෂය ක්ෂේත්‍රවල දැනුමැති වෘත්තිකයෙකු වශයෙන් සැලකිය හැකි ය.

ඔහුගේ වෘත්තීය කාලසීමාව තුළ දී, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විවිධ අංශ ආවරණය වන පරිද්දෙන් විවිධ බහුජාතික සමාගම්, ජාත්‍යන්තර සහ ප්‍රධාන පෙළේ ප්‍රමුඛතම සමාගම් සඳහා සිය සේවය ලබා දී ඇත. කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත වැවිලි සහ විනෝදාස්වාද අංශවල ලැයිස්තුගත සමාගම් සමූහයක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී තනතුර මොහු විසින් දරා තිබේ. 2023 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් පත් කෙරිණි.

ඒ.ඒ.එම්.තාසිම් මහතා
හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඒ.ඒ.එම්.තසීම් මහතා වසර 31කට අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයේ නියුතු අතර දැනට සහකාර අධිපති තනතුරක සේවය කරයි. මොහු ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් ද කටයුතු කරනු ලැබේ. මෙම පත්වීමට පෙර, මොහු වසර 4ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරෙහි සේවය කළ අතර මෙරට බැංකු ක්ෂේත්‍රය නියාමනය සහ අධීක්ෂණය සඳහා සහ බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වගකීම දරන ලදී. තව ද, මොහු ජාත්‍යන්තර මෙහෙයුම් අධ්‍යක්ෂ වශයෙන් ද කටයුතු කළ අතර විදේශ සංචිත ආයෝජනය සහ කළමනාකරණය සහ විනිමය අනුපාතිකය කළමනාකරණය සඳහා වගකීම දරන ලදී.

ගෙවීම් පද්ධති ක්ෂේත්‍රයේ අත්දැකීම් සහ දැනුම ද ලබා ඇති තසීම් මහතා ජාතික නිෂ්කාශන ආයතනය වන ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද කටයුතු කර තිබෙන අතර චෙක්පත් මූර්තනය සහ ලෝපනය කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දායකත්වය ලබාදෙන ලදී. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද මොහු කටයුතු කරන ලදී. මොහු ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලද අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උප සභාපති වශයෙන් ද කටයුතු කරනු ලැබේ.

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන තසීම් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබාගෙන තිබේ. ඇමරිකා එක්සත් ජනපදයේ, බර්ක්ලීහි කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ හාස් ස්කූල් ඔෆ් බිස්නස් වෙතින් රන් සංචිත කළමනාකරණය පිළිබඳ වැඩසටහනක් ද හදාරා ඇත. ජෝන් එෆ් කෙනඩි ස්කූල් ඔෆ් ගවන්මන්ට් විසින් පවත්වන ලද නායකයන් සඳහා විධායක වැඩසටහන ද සාර්ථක ලෙස නිමාකරමින් ඇමරිකා එක්සත් ජනපදයේ හාවඩ් විශ්වවිද්‍යාලයේ ද විද්‍යාර්ථියෙකු වේ.

ඒ.ඒ.අයි.දිල්රුක්ෂි මිය
හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඒ.ඒ.අයි.දිල්රුක්ෂි මහත්මිය, වසර තුනකට වැඩි කාලයක් මුළුල්ලේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක ලෙස සේවය කරනු ලැබේ. මෙම පත්වීමට ලැබීමට පෙරාතුව, ඇය වසර තුනක් රජයේ විගණන සේවයේ නිලධාරිනියක වශයෙන් කටයුතු කර තිබෙන අතර රාජ්‍ය අංශයේ ආයතන නියාමනය සහ අධීක්ෂණය කිරීමේ කටයුතු සඳහා වගකීම් දරන ලදී. තවද, මැය රජයේ ගණකාධිකාරී ස්වයේ වසර 19 කට අධික කාලයක් සේවය කර තිබේ.

සිය මූලික උපාධිය ලෙස කැළණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී විශේෂ උපාධිය පළමු පෙළ සාමාර්ථයක් සමගින් ලබාගෙන ඇති ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වේ. තව ද කැළණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමි ය.

බී.එම්.එස්.බණ්ඩාර මිය
හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

1995 වර්ෂයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක්වූ බී.එම්.එස්.බණ්ඩාර මහත්මිය, සහකාර ඉඩම් කොමසාරිස්වරියක වශයෙන් ඉඩම් කොමිෂන් සභාවේ සේවය කරන ලදී. ඉන් අනතුරුව, අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ක්‍රීඩා අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ යන ආයතනවල සේවය කර තිබේ.

1991 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් උද්භිද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය හිමිකර ගෙන තිබේ.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

අසුන්ගෙන (වමේ සිට දකුණට): රවීන් ඕවිටිගල මයා (සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය), මංජුල වික්‍රමසිංහ මයා (සහකාර සාමාන්‍යාධිකාරී - හිමිකම් සහ අත්කර ගැනීම්), යුෂාන් තරංග අබේකෝන් මයා (වැ.බ.සාමාන්‍යාධිකාරී), මහාචාර්ය (ආචාර්ය) ඒ ඒ.අරුණ ශාන්තආරච්චි මයා (සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ), මොහාන් සිල්වා මයා (වැ.බ.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්), ශාමා සෙල්වරත්නම් මෙය (සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි කටයුතු), වසන්ත මන්ත්‍රීපාල මයා (සහකාර සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්)

මධ්‍යම කළමනාකාරිත්වය

සිටගෙන (වමේ සිට දකුණට): ඒ.එච්.ඔබඩගේ මයා (කළමනාකරු - තොරතුරු තාක්ෂණ), අයි.ඒ.අමරතුංග මිය (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්), ඩී.වී.කහවිට මයා (අභ්‍යන්තර විගණක), එස්.මාතරගේ මිය (සහකාර කළමනාකරු - මානව සම්පත් සහ පරිපාලන), ටී.ඩී.බී.පීරිස් (සහකාර කළමනාකරු - මෙහෙයුම්), ඩී.යු.වික්රමසිංහ මයා (සහකාර කළමනාකරු - මෙහෙයුම්), කේ.ටී.ගුණතුංග මිය (සහකාර කළමනාකරු - හිමිකම් සහ අත්කර ගැනීම්), එන්.තවුෆීක් මිය (සහකාර කළමනාකරු - අලෙවි කටයුතු), ඩබ්.ඒ.ඩබ්.එල්.ජයරත්න මෙය (සහකාර කළමනාකරු - මෙහෙයුම්), එල්.ඩබ්.ඕ.පබසරා මෙය (සහකාර කළමනාකරු - අලෙවි කටයුතු), ඩී.එස්.ඒ.ප්‍රනාන්දු මයා (සහකාර කළමනාකරු - මූල්‍ය), කේ.ජී.ඒ.ප්‍රියංගිකා මිය (සහකාර කළමනාකරු - මෙහෙයුම් * නොපැමිණි)

නිමැවුම් සහ සේවා

මෙරට අපනයන ප්‍රජාවේ සහ අනෙකුත් විදේශ විනිමය උපයන්නන්ගේ පාර්ශවකරුවන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් සපයනු ලබන සේවාවලින් ප්‍රධානතම වනුයේ බැංකු සඳහා විකුණුම්කරුගේ අවදානම හා ණය ඇපකර වශයෙන් සන්නාමගත අපනයන ණය රක්ෂණය යි. වැඩි බාධාවකින් සහ අපහසුතාවයකින් තොරව වාණිජ බැංකුවලින් ණය ලබාගැනීම පහසුකරමින් අපනයනකරුවන්ගේ මෙහෙයුම් කටයුතුවල විෂය පථය පුළුල් කරගැනීම සඳහා හැකියාව ලබාදෙන අතරම, අපගේ සේවාවලින් අපනයනකරුවන්ගේ මූල්‍ය සුරක්ෂිතභාවය ආරක්ෂා කෙරේ.

විකුණුම්කරුගේ අවදානම
අපනයන ප්‍රජාව සඳහා වන අපගේ නිමැවුම් හා සේවාවල මූලික වැදගත් කොටස වනුයේ විකුණුම්කරුගේ අවදානම යි. වාණිජ හෝ දේශපාලන අවදානමක් හේතුවෙන් විදේශීය ගැනුම්කරු විසින් ගෙවීම් සිදු නොකිරීමේ හෝ ගෙවීම් ප්‍රමාද කිරීමේ අවදානමින් අපනයනකරු ආරක්ෂාකර ගැනීමේ කාර්යය මෙමගින් ඉටු වේ.

වාණිජ අවදානම්
- ණය ගෙවීමට නොහැකියාව සහ බංකොලොත්බව
- ගෙවීම් පැහැර හැරීම
- ගිවිසුම් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම

දේශපාලනික අවදානම්
- විදේශ විනිමය ප්‍රේෂණය කිරීම් ප්‍රමාද කිරීම
- ආනයන බලපත්‍ර අහෝසි කිරීම
- ආනයන තහනම් කිරීම
- ගෙවීම් තාවකාලිකව නතර කිරීම
- යුද්ධ, විප්ලව, කැරලි හා ස්වාභාවික ව්‍යසනයන්

සංස්ථාව විසින් පිරිනමනු ලබන පුළුල් පරාසයක රක්ෂණ ඔප්පු අතුරින්, පූර්ණ පිරිවැටුම් ආවරණ රක්ෂණ ඔප්පු වඩාත් ජනප්‍රිය වී තිබේ. විශේෂිත අංශවල එකී අංශවලට ආවේණික අවශ්‍යතා සපුරාලීම සඳහා එකී අවශ්‍යතාවලට අනුකූලවම සකස්කරන ලද පහසුකම් ද පවතී.

අපනයනකරුවන් සඳහා පිරිනමනු ලබන අපනයන ණය රක්ෂණ කාණ්ඩ පහත පරිදි වේ.

පූර්ණ පිරිවැටුම් රක්ෂණ ඔප්පුව - සියලු ගැනුම්කරුවන්
වාණිජ අවදානම් හා දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි. ගෙවීම කල්දැමීමේ කොන්දේසි මත පවතින සම්පූර්ණ නැව් භාණ්ඩ තොග අප විසින් මේ යටතේ ආවරණය කරනු ලැබේ.

ගැනුම්කරුට නිශ්චිත වූ රක්ෂණ ඔප්පුව
එක් ගැනුම්කරුවෙකු හෝ ඊට වැඩි නිශ්චිත ගැනුම්කරුවන්ගේ වාණිජ අවදානම් හා දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

රටකට නිශ්චිත වූ රක්ෂණ ඔප්පුව
යම් නිශ්චිත රටක ගැනුම්කරුවන්ගේ වාණිජ අවදානම් හා දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

දේශපාලනික අවදානම පිළිබඳ වූ රක්ෂණ ඔප්පුව
යම් නිශ්චිත රටක දේශපාලනික අවදානම්වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

ගෝලීය රක්ෂණ ආවරණ ඔප්පුව
ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතු කරන අක්වෙරළ අපනයන සමාගම් සඳහා පිරිනැමෙන රක්ෂණයකි.

පාලිත සමාගමක අවදානම ආවරණය කරන රක්ෂණ ඔප්පුව
මව් සමාගම ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති, වෙනත් රටක සංස්ථාපිත කර ඇති පාලිත සමාගමක අපනයනකරුවන්ගේ අවදානම ආවරණය කරන රක්ෂණයකි.

අවසන් ගැනුම්කරුවන්ගේ අවදානම ආවරණය කරන රක්ෂණ ඔප්පුව
ගැනුම්කරුගේ රටෙහි දී සම්පූර්ණයෙන් හිමිකම් දරන පාලිත සමාගමක් සඳහා නැව් භාණ්ඩ තොගය සකස් කර ඇති විටක දී, අවසන් ගැනුම්කරුවන්ගේ වාණිජ හා දේශපාලනික අවදානම් ආවරණය කරමින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

පැවරු හෝ හාරදුන් භාණ්ඩ තොගවල අවදානම ආවරණය කරන රක්ෂණ ඔප්පුව
පැවරු හෝ හාරදුන් භාණ්ඩ තොගවලට අදාළ වන වාණිජ හා දේශපාලනික අවදානම්වලින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

අන්තරාල වෙළඳාමේ
අන්තරාල වෙළඳාමට අදාළව පැනනඟින වාණිජ හා දේශපාලනික අවදානම්වලින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

විකුණුම්කරුගේ අවදානම් සඳහා පූර්ණ සේවා රක්ෂණ ඔප්පුව
වාණිජ හා දේශපාලනික අවදානම්වලින් සේවා අංශයේ ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

දේශීය ණය රක්ෂණය සඳහා අවදානම් රක්ෂණ ඔප්පුව
ශ්‍රී ලංකාවේ සිටින සිය ගැනුම්කරුවන් වෙත භාණ්ඩ පිටත් කිරීමට හා සේවා සැපයීමට අදාළ වාණිජ අවදානම්වලින් රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

බැංකු වෙත පිරිනමන ණය ඇපකර
අපනයනකරුවන්ගේ කල්ගත වූ ගෙවීම් පැහැර හැරීම් සහ බුන්වත්බව හේතුවෙන් අපනයනකරු විසින් ලබාගෙන ඇති අත්තිකාරම් සඳහා මුදල් නොගෙවීමෙන් බැංකු විසින් දැරිය යුතු පාඩු මෙම බැංකු වෙත පිරිනමන ණය ඇපකර මගින් ලිහිල් කෙරේ. බැංකු වෙත ලබාදෙන අපගේ ණය ඇපකර හේතුවෙන් අපනයනකරුවන් විසින් බැංකු වෙත ලබාදිය යුතු ඇපකර හා මිල අධික තැන්පතුවල අවශ්‍යතාවය ඉවත්වෙන අතර අපනයනකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සැලසේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් අපනයනකරුවන්ගේ පාර්ශවයෙන් ඇතිවන බුන්වත්බව හෝ කල්ගත වූ ගෙවීම් පැහැර හැරීම් හේතුවෙන් බැංකු විසින් දැරිය යුතු පාඩුවෙන් 66.66% සිට 85% දක්වා ප්‍රමාණයක් ප්‍රතිපූරණය කිරීම සඳහා වගකීම දරයි.

බැංකු වෙත පිරිනමන අපනයන ණය ඇපකර කාණ්ඩ පහත පරිදි වේ.

පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකර (තනි පුද්ගල)
තනි පුද්ගල ප්‍රතිපාර්ශව අවදානම ශ්‍රී ලංකා රුපියල්වලින් සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදලකින් 66.66%ක් දක්වා ආවරණය කළ හැකි ය. අමුද්‍රව්‍ය මිලදී ගැනීම්, භාණ්ඩ නිෂ්පාදනය හා සැකසීම හා අපනයන ඇසුරුම් කිරීම සඳහා ලැබී ඇති ණයවර ලිපි හෝ තහවුරු කළ ඇණවුම් සඳහා අපනයනකරුවන් වෙත මූල්‍ය සමාගම් විසින් පූර්ව නැව්ගත කිරීමේ පහසුකම් සැලැස්වීම සඳහා මෙම ඇපකර මඟින් පහසුකම් සැලසේ.

පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකර (තනි පුද්ගල)
මෙම ඇපකර වාණිජ බැංකු වෙත ප්‍රදානය කෙරේ. පශ්චාත් නැව්ගත කිරීමේ අවස්ථාවේ දී අපනයන බිල්පත් මිලදී ගැනුම්, ගනුදෙනු හෝ වට්ටම් කිරීම් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යායනය කරගැනීම සඳහා අපනයනකරුවන්ට බැංකු වෙත ප්‍රවේශය වීමට හැකිවීම සහතික කිරීම මෙමගින් සිදු වේ.

පූර්ණ පිරිවැටුම පූර්ව/ පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකරය
මෙම ඇපකර මගින් ඉහළ රක්ෂණ ආවරණයක් සහ අඩු රක්ෂණ වාරික අනුපාතිකයක් යටතේ අපනයනකරු වෙත හෝ වක්‍ර අපනයනකරුවෙකු වෙත පූර්ව/පශ්චාත් නැව්ගත කිරීම් අත්තිකාරම් ආකාරයෙන් ප්‍රදානය කරන සම්පූර්ණ ණය ප්‍රමාණය ආවරණය කිරීම සඳහා බැංකු වෙත පහසුකම් සලස්වයි.

අපනයන නිෂ්පාදන ණය ඇපකර
ඇපකර සම්බන්ධයෙන් වැඩි අවධාරණය කිරීමකින් තොරව, අපනයනකරුවන් වෙනුවෙන් භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදකයන් සඳහා කාරක ප්‍රාග්ධනය මූල්‍යායනය කිරීම සඳහා මෙමගින් මූල්‍ය ආයතන වෙත පහසුකම් සලස්වනු ලැබේ.

අපනයන කාර්යසාධන ඇපකර
ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ සහ සේවා අපනයන කිරීම සඳහා එළඹී ඇති ගිවිසුම්වල නිසි පරිද්දෙන් ඉටු කිරීම සම්බන්ධයෙන් සහතික වෙමින් විදේශීය ගැනුම්කරුවන් හෝ රජයේ අධිකාරීන් වෙත බැංකු විසින් සිය සේවාදායකයන් වෙත නිකුත් කරන ඇපකර සහ බැඳුම්කර වෙනුවෙන් එකී වාණිජ බැංකු වෙත සංස්ථාව විසින් නිකුත් කරන ප්‍රති ඇපකරයකි. ඉදිකිරීම් කටයුතු මෙන්ම භාණ්ඩ හා සේවා අපනයන ඔස්සේ ප්‍රමිතිගත අපනයන කොන්ත්‍රාත් මීට ඇතුළත් වේ.

භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ගේ නිසි කාර්යසාධනය ආවරණය කරන අපනයන කාර්යසාධන ණය ඇපකර
භාණ්ඩ ප්‍රවාහනය කරන්නෙකු වෙත ගුවන් සේවා සමාගමක් විසින් ලබා දෙන ණය පහසුකම වෙනුවෙන් බැංකුවක් විසින් නිකුත් කරන බැංකු ඇපකරය සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් බැංකුව වෙත නිකුත්කරන ප්‍රති ඇපකරයකි.

අනෙකුත් සේවා

මෙරටින් බැහැරවීමේ පිරිවැය - ඇපාරා
සංක්‍රමික සේවකයන් සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් මෙරටින් බැහැර වීමේ පිරිවැය ආවරණය කරමින් බැංකු ඇපකර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. සංක්‍රමික සේවකයන්ට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම සඳහා වාණිජ බැංකු විසින් ලබාදෙන අත්තිකාරම් ආවරණය කිරීම සඳහා මෙය 1992 වර්ෂයේ හඳුන්වා දෙනු ලැබූ අතර මෙම අංශය සඳහා බැංකු විසින් පහසුකම් සැලසීමේ දී අවම ලේඛන අවශ්‍යතාවයක් සහිත හා බැංකුවල අවදානම දරා සිටින සමස්ත පිරිවැටුම් ණය ඇපකර යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ.

ඇපාරා යෝජනා ක්‍රමය ඔස්සේ මෙරට සිටින බලාපොරොත්තු සහගත පුරවැසියන් වෙත විදේශ රැකියා ලබාගැනීමට හා දුගීබවෙන් මිදීමේ අවස්ථාව සලස්වයි. අපේක්ෂා සපිරි ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරගැනීම සඳහා සහ මෙරට ආර්ථික දියුණුව සඳහා දායකවීමේ අවස්ථාව ලබා දීමට සංස්ථාව කැමැත්තෙන් පසුවෙන අතර එමගින් ප්‍රේෂණ වැඩි වී විදේශ විනිමය සංචිත ද වර්ධනය වනු ඇත.

ATA Carnet System ආවරණය කෙරෙන සෘජු අපනයන කාර්යසාධන ඇපකර
ATA Carnet යනු වෙළඳ සල්පිල්, ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රවර්ධන අරමුණු වෙනුවෙන් භාවිතා කිරීම සඳහා තීරුබදු නිදහස්ව නිශ්චිත කාලසීමාවක් සඳහා භාණ්ඩ සහ වාණිජ සාම්පල තාවකාලිකව ආනයනය සඳහා අවසර ලබාදෙන ජාත්‍යන්තර රේගු ලේඛන වේ.

ATA Carnet මගින් වාණිජ සාම්පල, ඉදිරිපත් කිරීම් හෝ වෙළඳ සල්පිල්, ප්‍රදර්ශන හා එසමාන අවස්ථා සඳහා වෘත්තීය උපකරණ සහ භාණ්ඩ ආවරණය වේ. අපනයනකරුවෙකු වාණිජ සාම්පල් සහ වෙළඳ ප්‍රදර්ශන සඳහා ප්‍රදර්ශන භාණ්ඩ රැගෙන එක් රටකින් තවත් රටකට යැමට අපේක්ෂා කරන්නේ නම්, ATA Carnet හරහා රේගු නිෂ්කාශන කටයුතු සඳහා වැයවන ඔහුගේ/ ඇයගේ කාලය ඉතිරි කරන අතර සංචාරය ද වේගවත් කර දෙනු ලැබේ.

ATA Carnet භාවිතාකරුවන්

ATA Carnet භාවිතා කරන්නන් තනි පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක් විය හැකි ය.

- සංචාරක ව්‍යාපාරික/ අලෙවි විධායකයින්
- කාර්මික ශිල්පීන්
- වෙළඳ ප්‍රදර්ශකයින් සහ චිත්‍රපටි කණ්ඩායම්, ශල්‍ය වෛද්‍යවරුන්, කලා ශිල්පීන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවරුන්, අධ්‍යාපඥයින්, විනෝදාස්වාදය සැපයුම්කරුවන් ආදී තනි වෘත්තිකයින් හෝ කණ්ඩායම්
- වෙනත් ඕනෑම තැනැත්තෙකු විසින් Carnet භාවිතා කිරීමට අවශ්‍ය කෙරේ නම්, ඔහු වෙත බලය පවරා දෙමින් Carnet දරන්නා විසින් නිකුත් කරන ලද ලිපියක් රැගෙන යා යුතු ය.

ATA Carnet System ඔස්සේ ආවරණය කෙරෙන සෘජු අපනයන කාර්යසාධන ඇපකර ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත නිකුත් කරන අතර, ඇපකර සුරක්ෂණයක් රහිතව ATA Carnet රේගු ලේඛන අපනයනකරුවන්ට, විශේෂයෙන් මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන්ට ලබාගත හැකි ය. මෙම රේගු ලේඛනය මගින් අපනයනකරුවන්ට විදේශයන්හි පැවැත්වෙන වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගීවීමේ හැකියාව ලබාදෙන අතර අපනයන කොන්ත්‍රාත් ලබාගෙන ලාභ උපරිම කරගැනීමේ අවස්ථාව උදා කෙරේ. සංස්ථාව විසින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වෙත නිකුත් කළ හැක්කේ එක් සෘජු ඇපකරයක් පමණි.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ ආවරණය

ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා සහාය දැක්වීම සඳහා මැදපෙරදිග කලාපයේ පවතින දේශපාලනික අවිනිශ්චිතතා මධ්‍යයේ වුව ද මැදපෙරදිග රටවල්ද ඇතුළුව, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් දැනට විවිධ වූ "විකුණුම්කරුවන්ගේ අවදානම්" වශයෙන් වූ රක්ෂණ හිමිකම් ඔප්පු යටතේ රටවල් 152 ක දේශපාලනික අවදානම් ආවරණය කෙරේ. එක් එක් රටවල පවතින අවදානම් පාදක කරගෙන එම රටවල් A1, A2, A3, A4, B, C සහ D වශයෙන් වූ කාණ්ඩ 07කට වර්ගීකරණය කෙරේ. කලාප 8 හරහා 2024 වර්ෂයේ දී පැවති රක්ෂණ ආවරණය පහත ප්‍රස්තාරය මගින් නිරූපණය කෙරේ.

කලාපය	රටවල් සංඛ්‍යාව
අප්‍රිකාව	48
ආසියාව	16
මධ්‍යම සහ දකුණු ඇමරිකාව	30
නැගෙනහිර යුරෝපය	16
මැද පෙරදිග	5
උතුරු ඇමරිකාව සහ කැරබියන්	7
පැසිපික්	9
බටහිර යුරෝපය	21
එකතුව	**152**



ඉහත ප්‍රස්තාරය අනුව, සංස්ථාව විසින් විශේෂයෙන් ඉහළ අවදානමක් සහිත අප්‍රිකානු හා මැද පෙරදිග කලාපයේ රටවල් සඳහා මනා ආවරණයක් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. සංස්ථාව විසින් අප්‍රිකානු කලාපයේ රටවල් 38ක්, මධ්‍යම සහ දකුණු ඇමරිකානු කලාපයේ රටවල් 30ක්, බටහිර යුරෝපයේ රටවල් 21ක් ආසියාවේ රටවල් 16ක්, නැගෙනහිර යුරෝපයේ රටවල් 16 ක් සහ පැසිපික් කලාපයේ රටවල් ආවරණය වන පරිදි රක්ෂණ කටයුතු සිදුකර ඇත. ආත්ම විශ්වාසයෙන් යුතුව ඉහළ ලාභයක් ලැබීම සඳහා අවදානමක් සහිත වෙළඳපොළවල් වෙත ඇතුල්වීම සඳහා කැමැත්තක් දක්වන ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා මෙය වාසිදායක සලකුණකි.

රක්ෂිත ව්‍යාපාර

අභියෝගාත්මක වෙළඳපොළ පරිසරයක දී, සංස්ථාව විසින් රු.මිලියන 58,305.87 ක ව්‍යාපාර රක්ෂණය කර ඇති බව වාර්තාකර තිබේ. මෙය මීට පෙර වර්ෂයට වඩා රු. මිලියන 2,760.0ක (සියයට 5.0) වැඩි වීමකි.

රක්ෂිත ව්‍යාපාර (රු.මිලියන)	
වර්ෂය	එකතුව
2021	49,298.69
2022	70,002.35
2023	55,545.76
2024	58,305.87



2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් රක්ෂණය කර ඇති ව්‍යාපාර මාසික වශයෙන් පහත ප්‍රස්තාරයේ දැක්වේ.



Insured Business 2021-2024 (Rs. Mn)												
Year	**Jan**	**Feb**	**Mar**	**April**	**May**	**June**	**July**	**August**	**Sept**	**Oct**	**Nov**	**Dec**
2021	4,729.88	3,788.81	5,415.03	3,412.22	3,720.86	4,053.11	4,222.10	3,989.66	3,811.73	3,992.61	4,064.15	4,098.54
2022	3,842.71	4,114.43	4,897.13	3,837.54	6,636.66	6,937.00	7,647.40	8,281.27	6,418.73	6,399.94	5,561.18	5,428.35
2023	6,092.10	4,105.87	5,366.44	3,607.96	3,926.17	3,663.98	4,511.87	4,382.06	4,674.69	5,351.54	5,166.96	4,696.13
2024	5,301.72	4,982.25	6,139.73	3,568.87	5,095.51	4,357.05	4,657.51	5,507.80	5,352.79	4,575.94	3,944.74	4,821.94

ප්‍රමුඛතම වෙළඳපොළවල් 05 - රක්ෂිත ව්‍යාපාර

රට	2024 (රු.මි.)	රක්ෂිත ව්‍යාපාරවල පංගුව	2023 රු.මි.	රක්ෂිත ව්‍යාපාරවල පංගුව
ඇ.එ.ජ.	8,917.44	15.30%	9,466.83	17%
එ.රාජධානිය	7,509.79	13%	6,623.98	12%
බ්‍රසීලය	4,330.72	7.40%	4,699.85	8%
චීනය	2,438.33	4.20%	3,668.54	7%
දකුණු කොරියාව	2,393.26	4.10%	1,702.89	3%
අනෙකුත්	32,716.32	56%	29,383.67	53%
එකතුව	**58,305.87**	100%	**55,545.76**	100%

2023 වර්ෂයට සාපේක්ෂව 2024 මූල්‍ය වර්ෂයේ දී එක්සත් රාජධානිය සහ දකුණු කොරියාව වෙත සිදුකළ අපනයන පිළිවෙලින් 13.37% සහ 40.54% කින් ඉහළ ගොස් ඇති අතර, ඇ.එ.ජනපදය, බ්‍රසීලය සහ චීනය වෙත සිදුකළ අපනයන පිළිවෙලින් 5.80%, 7.85% සහ 33.53% කින් පහළ ගොස් තිබේ.

ජර්මනිය, රුසියාව, ප්‍රංශය, නෙදර්ලන්තය, සිංගප්පූරුව, එ.අ.එමීර් රාජ්‍යය, තුර්කිය, ද. අප්‍රිකාව, මොරොක්කෝ සහ ස්වීඩනය වැනි රටවල දී පෙර වර්ෂයට සාපේක්ෂව රක්ෂිත ව්‍යාපාරවල සුවිශේෂී ඉහළ යෑමක් වාර්තාවන බව ද නිරීක්ෂණය වේ.



රක්ෂිත ව්‍යාපාරවල ව්‍යාප්තිය - කලාපීය වශයෙන් -2024

සංස්ථාව විසින් 2024 වර්ෂයේ දී සිදුකළ රක්ෂිත ව්‍යාපාර කලාප 08 ක් හරහා ව්‍යාප්තවී ඇති ආකාරය පහත දැක්වේ.

රක්ෂිත ව්‍යාපාර 2023 - 2024 (කලාපීය වශයෙන්)			
කලාපය	පංගුව (රු.මි.)		පංගුව (%)
	2023	2024	2024
බටහිර යුරෝපය	10,630.14	19,637.28	33.68
ආසියාව	3,365.84	10,783.36	18.49
උතුරු ඇමරිකාව	10,746.74	9,580.84	16.43
මධ්‍යම සහ දකුණු ඇමරිකාව	11,259.08	4,961.24	8.51
නැගෙනහිර යුරෝපය	2,101.47	4,758.54	8.16
මැද පෙරදිග	625.82	3,434.46	5.89
අප්‍රිකාව	12,410.24	3,194.14	5.48
පැසිපික්	4,406.43	1,956.01	3.35
එකතුව	**55,545.76**	**58,305.87**	**100**



රක්ෂිත ව්‍යාපාරවලින් 33.35%ක් බටහිර යුරෝපා රටවලට අදාළ වන අතර පූර්ව වර්ෂයට සාපේක්ෂව වර්ෂය තුළ 84.73ක ඉහළ යෑමක් වාර්තා කර තිබේ. ආසියානු කලාපය රක්ෂිත ව්‍යාපාරවලින් 18.49% ක් සඳහා අදාළ වන අතර සමාලෝචිත වර්ෂය තුළ සියයට 220.37% ක සුවිශේෂී වර්ධනයක් වාර්තා කර තිබේ. එමෙන්ම, 2024 වර්ෂයේ දී නැගෙනහිර යුරෝපය සහ මැද පෙරදිග කලාපය පිළිවෙලින් රක්ෂිත ව්‍යාපාරවලින් 8.16%ක සහ 5.89%ක පංගුවක් සඳහා අදාළ වන අතර, මෙම වර්ෂය තුළ 126.43%ක සහ 448.79%ක සුවිශේෂී වර්ධනයක් වාර්තා කර ඇත. උතුරු ඇමරිකා කලාපයට රක්ෂිත ව්‍යාපාරවලින් 16.43 %ක් අදාළ වන අතර එකී අගය මධ්‍යම හා දකුණු ඇමරිකාව සඳහා 8.51% කි. එසේම 2024 වර්ෂය තුළ අප්‍රිකානු කලාපය රක්ෂිත ව්‍යාපාරවලින් 5.48% ක් සහ පැසිපික් කලාපය රක්ෂිත ව්‍යාපාරවලින් 3.35 % ක් වශයෙන් හවුල්කාරිත්වය දරන ලදී.

ඇතැම් අවිනිශ්චිත වෙළඳපොළවල් ආශ්‍රිතව අවදානම් සංකේන්ද්‍රණය වීම අවම කරමින් වඩාත් පුළුල් වෙළඳපොළවල් තුළ මෙහෙයුම් පවත්වා ගැනීම සහතික කිරීම පිණිස සංස්ථාව විසින් රටවල් වශයෙන් අවදානම් ආවරණය පවත්වා ගැනීම වැදගත් වේ. වඩාත් හොඳ ජාත්‍යන්තර වෙළඳපොළවල් අත්පත් කරගැනීම සඳහා නිරතුරුවම අපගේ ඔප්පු හිමියන් දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සිදුකළ යුතු ය.

ණය සීමා

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ආවරණ නිකුත් කිරීම, ණයදීමට සුදුසු ගැනුම්කරුවන්ගේ සඳහා ණය සීමා නිකුත් කරමින් ගැනුම්කරුවන්ගේ රක්ෂණ වගකීම් භාරගැනීම ඔස්සේ සංස්ථාව විසින් අඛණ්ඩව අපනයනකරුවන් වෙත සහාය දක්වා තිබේ. රක්ෂණ වගකීම් භාරගැනීමේ තීරණ මූලික වශයෙන් ගැනෙනුයේ ගැනුම්කරු සම්බන්ධයෙන් පවතින තොරතුරු විශ්ලේෂණය කිරීමෙනි. මෙම ක්‍රියාවලිය ප්‍රධාන පියවර තුනක් ඔස්සේ සිදු කෙරේ. පළමු පියවර වනුයේ ගැනුම්කරුගේ විස්තර සටහනක් සකස් කරගැනීමයි. දෙවන පියවර වනුයේ ලකුණු සටහන්පත සකස් කිරීම යි. අවසන් පියවර වනුයේ ගැනුම්කරු සම්බන්ධයෙන් සිදුකරන හෙළිදරව් වලට අදාළව තීරණයකට එළඹීම යි. මූලිකවම අවධානය යොමු වනුයේ වර්තමානයේ පවතින දත්ත මත පදනම්ව, අනාගතයේ දී බැඳීමකට අදාළ කාර්යය ඉටු කිරීම සඳහා ගැනුම්කරුට ඇති හැකියාව හඳුනාගැනීම යි. අවදානම් හඳුනාගැනීම, වර්ගීකරණයේ දී ලකුණු සටහන්පත අනුව ගැනුම්කරු මත පවතින අවදානමේ සංසන්දනාත්මක මට්ටම හා ගැනුම්කරු සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් මත පදනම්ව ගැනුම්කරු පිළිගනු ලබන්නේ ද යන්න හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය උපකාර වේ.

නිකුත් කළ සහ වැඩිකළ සමස්ත ණය සීමා සහ (රු.මිලියන)	
වර්ෂය	වටිනාකම
2022	7,100
2023	11,920
2024	10,009



ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් විශ්වාස කරනුයේ ඵලදායි ණය පාලනය, පාඩු අවම කරගැනීම හා ගැනුම්කරුගේ විසින් ගෙවීම් පැහැර හැරීම් හසුරුවා ගැනීම සම්බන්ධයෙන් අපනයනකරුවන්ගේ ප්‍රජාව දැනුවත් කිරීම වනාහී ඔවුන්ගේ අවදානම් ආවරණය කරගැනීම සඳහා රක්ෂණයක් සැපයීම තරම්ම වැදගත් කාර්යයක් බව ය. නිරවද්‍ය දැනුම සමඟින්, අපනයනකරුවෙකුට ගෙවීම් පැහැර හැරීම් සිදුකරන ගැනුම්කරුවන් සමග කටයුතු කිරීමේ දී මනා ස්ථානයක සිට කටයුතු කිරීමට හැකිවනු ඇත. සංස්ථාවේ රක්ෂණ වගකීම භාරගැනීමේ ක්‍රමෝපාය යටතේ සමබර අවදානම් කළඹක් තහවුරු කිරීම සඳහා විවිධත්වය අපේක්ෂා කෙරේ. ඒ අනුව, වගකීමේ විචල්‍යතාවය අවම කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අපගේ ඔප්පු හිමියන් සඳහා ඵලදායි ණය කළමනාකරණ සේවාවක් ලබාදීමේ දී, අවදානම් තක්සේරුව සඳහා අඛණ්ඩව අපගේ වෘත්තීය නිපුණතාවය අඛණ්ඩව උපයෝගීකරගැනීම හා විචක්ෂණශීලි හා ප්‍රගාමී රක්ෂණ වගකීම් භාරගැනීමේ ප්‍රවේශයක් පවත්වා ගැනීමට අප පූර්ණ වශයෙන් කැපවී සිටින්නෙමු. මෙම කැපවීම සාර්ථක අන්දමින් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා රක්ෂණකටයුතුවල නියැලීමේ විශිෂ්ට මට්ටමේ කුසලතාවයක් පමණක් නොව වඩාත් විශ්වාසනීය හා වඩාත්ම පිරිවැය ඵලදායි ණය තොරතුරු මූලාශ්‍ර වෙත ප්‍රවේශයක් පැවතීම ද අවශ්‍ය කෙරේ

රක්ෂණ කාර්යයේ නියැලෙන පිරිස් ප්‍රරාරක්ෂණ අධිකාරින් වෙත යොමුකරන අතර ඔවුන්ගේ මට්ටම හා පලපුරුද්ද අනුව ඔවුන්ට නිකුත් කළ හැකි ප්‍රමාණ සීමා කරනු ලැබේ. 2024 වර්ෂයේ දී රු. මිලියන 10,009.29 ක වටිනාකමක් දරන ගැනුම්කරු වගකීම් සීමා (BLL) 356ක් නිකුත් කර ඇති අතර මීට සාපේක්ෂව 2021 වර්ෂයේ දී පවතිනුයේ රු. මිලියන 11,923.33 කි.

ATA Carnet ඇපකර

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් නිකුත් කරන ATA Carnet ඇපකරයක් සහ ඒ සඳහා සංස්ථාව මගින් ලබාදෙන ප්‍රති ඇපකරය සමඟින් විදේශ ප්‍රදර්ශනවලට සහභාගීවී සිය වටිනා නිෂ්පාදන ප්‍රදර්ශනය කරන මෙන් සංස්ථාව විසින් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අපනයනකරුවන් ප්‍රවර්ධනය කරනු ලැබේ.

මෙම වර්ධනය වෙමින් පවතින ක්ෂේත්‍රයේ අපනයනකරුවන් විසින් සංස්ථාව ලබාදෙන කඩිනම් හා විශ්වාසනීය සේවය අගය කරනු ලැබේ.

ATA Carnet ඇපකරය		
වර්ෂය	නිකුත්කළ ඇපකර සංඛ්‍යාව	වටිනාකම (රු.මි.)
2022	1	1
2023	26	41.21
2024	35	66.29



සංස්ථාව විසින් 2023 වර්ෂයේ දී නිකුත් කළ රු.මිලියන 41.21 ක වටිනාකමින් යුතු ATA Carnet ඇපකර 26ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී රු.මිලියන 66.29 ක වටිනාකමින් යුතු ATA Carnet ඇපකර 35ක් නිකුත් කර ඇත. මෙය පෙර වර්ෂයේ වටිනාකමට සාපේක්ෂව 60.85%ක වර්ධනයකි.

මෙරටින් බැහැරවීමේ පිරිවැය (ඇපාරා) ඇපකරය

සමාලෝචිත වර්ෂයේ දී නිපුණතා කාණ්ඩයේ විගමනික සේවකයන්ට මෙරටින් බැහැරවීමේ පිරිවැය ඇපාරා ඇපකර යටතේ බැංකු මගින් ලබාගැනීමට අවස්ථාව සැලසීමෙන් අගනා සහායක් ලබාදෙන ලදී.

වර්ෂය	නිකුත්කළ ඇපකර සංඛ්‍යාව	වටිනාකම (රු.මි.)
2022	447	227.73
2023	1,152	1,469.36
2024	4,113	4,144.84

සංස්ථාව විසින් 2023 වර්ෂයේ දී නිකුත් කළ රු.මිලියන 1,469.36 ක වටිනාකමින් යුතු ඇපාරා ඇපකර 1,152ට සාපේක්ෂව 2024 වර්ෂයේ දී මෙම නිමැවුම් කාණ්ඩය යටතේ රු.මිලියන 4,144.84 ක වටිනාකමින් යුතු ඇපකර 4,113ක් නිකුත් කර ඇත. මෙය පෙර වර්ෂයට වඩා 257% ගුණයකින් නව අයදුම්කරුවන් සඳහා පහසුකම් සැලසීමේ සුවිශේෂී ඉහළ යෑමකි.



ජාත්‍යන්තර සබඳතා:
ආරක්ෂණවාදය, සැකමුසුබව හා අවිනිශ්චිතබව ඉහළ යමින් පවතින කාලවකවානුවක, ගෝලීය සබඳතා ඉදිරියට ගෙනයෑම, සවිමත් කිරීම හා රැකගැනීම වඩාත් වැදගත් වේ. ජාත්‍යන්තරීකරණය සඳහා පවතින සිය අතිමහත් කැපවීම ප්‍රදර්ශනය කරමින් ආයතන අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ වැඩිදියුණු කරගැනීම උදෙසා අදාළ ජාත්‍යන්තර ආයතන සමඟ සමීප සබඳතාවයක් පවත්වා ගන්නා ලදී. සංස්ථාව විසින් සමීප සබඳතාවයක් පවත්වාගන්නා ජාත්‍යන්තර ආයතන වනුයේ:

ණය සහ ආයෝජන රක්ෂණකරුවන්ගේ ජාත්‍යන්තර සංගමය (බර්න් සංගමය)
බර්න් සංගමය යනු ජාත්‍යන්තර අපනයන ණය සහ ආයෝජන රක්ෂණකරුවන් සඳහා ගෝලීය වශයෙන් පවතින ප්‍රධානතම සංගමය වන අතර, සහයෝගිතාවය, ප්‍රතිපත්තිමය කරුණු, සහ මෙම ක්ෂේත්‍රයේ මනා පරිචයන්ගේ වැඩිදියුණු කරලීම සඳහා පවතින මධ්‍ය ආයතනය වේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව 1983 වර්ෂයේ සිට අපනයන ණය රක්ෂණයේ ප්‍රවණතා සම්බන්ධයෙන් දැනුවත් සිටීමට සහ ජාත්‍යන්තර ප්‍රමිති අනුව ක්‍රියාත්මකවීමට ඇති කැපවීම ප්‍රදර්ශනය කරන බර්න් සංගමයේ පූර්ණ සාමාජිකයෙකි.

කණ්ඩායමක් වශයෙන්, බර්න් සංගමයේ සාමාජිකයන් විසින් සෑම වර්ෂයකම ඇ.ඩො. ට්‍රිලියන 2.5 ක පමණ අවදානම් ආවරණයක් අපනයනකරුවන්, බැංකු සහ ආයෝජකයන් වෙත ගෙවීම සිදුකරන අතර, මෙමඟින් රටවල් අතර දේශසීමා මායිම් ඔස්සේ සිදුකරන භාණ්ඩ හා සේවා වෙළඳාමෙන් 13%ක් පමණ ආවරණය කෙරේ. ශ්‍රී ලංකා අපනයන රක්ෂණ සංස්ථාව බඳු බර්න් සංගමයේ පූර්ණ සාමාජිකයෙකු වන ඉන්දියාවේ E C G C ද ඇතුළුව ලෝකයේ සියලු කලාපවල නිල අපනයන ණය නියෝජිතායතන, බහුපාර්ශ්වික මූල්‍ය ආයතන සහ පුද්ගලික අංශයේ රක්ෂණකරුවන් ඇතුළත් සංයෝජනයකින් බර්න් සංගමයේ සාමාජිකත්වය සමන්විත වේ. ශ්‍රී ලංකා අපනයන රක්ෂණ සංස්ථාව ද ඇතුළුව දැනට බර්න් සංගමයේ පූර්ණ සාමාජිකත්වය 86 කි.

බර්න් සංගමයේ පූර්ණ සාමාජිකයෙකු වශයෙන්, සංස්ථාවට එහි දත්ත වෙත ප්‍රවේශ විය හැකි අතර ණය අවදානම් අඩුකර ගැනීම සඳහා එහි ප්‍රතිලාභ ලබාගත හැකි ය. තව ද, සංස්ථාව වෙත එම සංගමයේ තොරතුරු වෙත පූර්ණ ප්‍රවේශය ලබා දී ඇති බැවින් ණය සීමා කල්ගතවීමේ අවස්ථා වැනි අපනයන ණය රක්ෂණයට ආවේණික අවදානම් මග හරවා ගැනීමට එය උපයෝගී කරගත හැකිය. දේශීය වශයෙන් අපනයන ණය රක්ෂණ සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා අපනයන රක්ෂණ සංස්ථාවට ලැබී ඇති ජාත්‍යන්තර බලපත්‍රයක් සහ පිළිගැනීමක් ලෙස මෙම සාමාජිකත්වය සැලකිය හැකි ය.

කලාපීය සහයෝගීතා කණ්ඩායම (RCG)
කලාපීය සහයෝගීතා කණ්ඩායම (R C G) යනු කලාපයේ අපනයන ණය නියෝජිතායතන අතර සමීප සහයෝගිතාවය සහ ජාත්‍යන්තර සබඳතා සඳහා බර්න් සංගමයේ කොටසක් ලෙස 1986 දී ස්ථාපනය කරන ලද ආසියා-පැසිපික් කලාපයේ සාමාජික ආයතන 12 ක කණ්ඩායමකි. කලාපීය සහයෝගීතා කණ්ඩායම ඔස්සේ සංවාද හා දැනුම බෙදා ගැනීම සඳහා කලාපීය පදනමින් සංසදයක් ලබාදෙන අතර, කලාපයේ ආර්ථික හා වෙළඳ සබඳතා ආශ්‍රිත මනා පරිචයන් සාමාජික ආයතන අතර ගොඩනංවා ගැනීම ද සිදුවේ. ඒ අනුව, කලාපීය අවේණික ලක්ෂණ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ ආසියා-පැසිපික් කලාපයේ අපනයන ණය නියෝජිතායතනවල අනාගත කාර්යභාරය සකස් කරගැනීම සඳහා මෙම කලාපීය සහයෝගීතා කණ්ඩායම වඩාත් උචිත වේ.

ආසියානු ණය පරිපූරක ආයතනික සන්ධානය (ACSIC)
ආසියානු ණය පරිපූරක ආයතනික සන්ධානය (ACSIC) යනු 1987 වර්ෂයේ සිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා පවතින විශාලතම ආසියානු සහයෝගීතා ආයතනය යි. වර්තමානයේ දී, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ද ඇතුළුව සාමාජික රටවල් 12ක ණය ඇපකර ආයතන 17ක් පවතී. සංස්ථාව මෙම සන්ධානයේ සාමාජිකත්වය ලබා ඇත්තේ 2016 වර්ෂයේ දී ය.

මෙම සන්ධානයේ ප්‍රධාන අරමුණ වනුයේ කලාපය තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ණය අතිරේක පද්ධතියක තිරසර වර්ධනය සහ ආයතනික සවිමත්බව ප්‍රවර්ධනය කිරීම සහ සමාජික ආයතන අතර තාක්ෂණික සාධ්‍යතාවයන් හුවමාරුව, ප්‍රතිපත්ති සංවාද, සහයෝගිතා පර්යේෂණ සහ මානව සම්පත් හුවමාරුව වැනි ආකාරවලින් මෙය සාක්ෂාත් කරගැනීම වේ. අවසානයේ දී, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ ධාරිතාවය ACSIC මගින් ඉහළ යනු ඇති අතර කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය සහ මූල්‍ය අංශයේ සංවර්ධනය සඳහා ද රුකුලක් වනු ඇත.

ආසියානු අපනයන හා ආනයන බැංකු සංසදය (AEBF)
අපනයන ණය නියෝජිතායතනයක් වශයෙන් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට ආසියානු අපනයන හා ආනයන බැංකු සංසදය සමග ප්‍රබල හවුල්කාරිත්වයක් පවතී. එක්සිම් බැංකු සහ අපනයන ණය නියෝජිතායතන අතර සහයෝගිතා සංසදයක් වශයෙන් මෙය ගොඩනැගුනු අතර මීට මූලාරම්භය ලබාදෙන ලද්දේ 1996 වර්ෂයේ දී ඉන්දියාවේ අපනයන හා ආනයන බැංකුව විසිනි. ආසියානු අපනයන හා ආනයන බැංකු සංසදය එහි සමාරම්භයේ සිට සාමාජික රාජ්‍යයන් මාරුවෙන් මාරුවට සත්කාරකත්වය දක්වමින් වාර්ෂික වශයෙන් රැස්වෙනු ලැබේ. කලාපයේ වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති, දැනුම් සහයෝගිතාවය, සහ සහයෝගිතා සාකච්ඡා අඛණ්ඩව සිදුකර යෑමේ අංගයක් ලෙස සෑම වාර්ෂික රැස්වීමකදී ම නව මාතෘකාවක් සාකච්ඡාවට ගැනේ.

පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය
ප්‍රජාතන්ත්‍රවාදය, සංවර්ධනය සහ ආර්ථික සහයෝගීතාවය යන විශ්වීය වටිනාකම් සඳහා පොදු කැපවීමක් සහිත පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය යනු රටවල් 56කින් සමන්විත පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන්ගේ මූලික ආයතනයයි. සිය සාමාජිකයන් සඳහා යහපාලනයේ අභිවෘද්ධීන් සහ ධාරිතා සංවර්ධන අවස්ථා ඇතුළුව තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මෙම ලේකම් කාර්යාලයේ ඉතාමත් වැදගත් ප්‍රමුඛතාවය වේ.

පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය විසින් වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සඳහා පුළුල් වශයෙන් සහාය ලබාදී ඇත. ආයතනික ධාරිතාවය වැඩිදියුණු කිරීමේ සහ මෙහෙයුම් ඵලදායිතාවය වැඩිකිරීමේ අරමුණු ඇතිව තාක්ෂණික සහ මූල්‍ය යන දෙඅංශයෙන්ම ලබාදී ඇති සහායන් මීට ඇතුළත් වේ. එනම්, සංස්ථාවේ කාර්ය මණ්ඩලය සඳහා විශේෂිත ජාත්‍යන්තර පුහුණු අවස්ථා ලබාදීම, සංස්ථාව වෙත කාර්ය පටිපාටි අත්පොත් සකස් කිරීම සඳහා ලබාදෙන මූල්‍ය සහාය ආදී වශයෙනි.

ගෙවන ලද හිමිකම්

සමාලෝචිත වර්ෂය තුළ ණය රක්ෂණය යටතේ හිමිකම් පියවීම ඔස්සේ අපනයනකරුවන්ට සිය අපනයන කටයුතු අඛණ්ඩව කරගෙන යෑමට රුකුලක් වූ අතර, සංස්ථාව මගින් ලබා දී ඇති ආවරණයට අනුකූලව බැංකු විසින් එකී අපනයනකරුවන්ගේ හිමිකම් ප්‍රතිපූරණය කරන ලදී.

අනුකූල නොවීම හේතුවෙන් පැන නගින හිමිකම් ප්‍රතික්ෂේප වීම වළක්වාගැනීම සඳහා රක්ෂණ ඔප්පු හිමිකරු විසින් රක්ෂණ ගිවිසුමේ නියමයන් හා කොන්දේසි සමඟ දැඩිව අනුකූල වීම ඉතා වැදගත් වේ. රක්ෂණ ආවරණය බලාත්මකව පවතින අවස්ථාවක දී මූල්‍ය හානියක් ප්‍රතිඵල වෙමින් හිමිකම් ලබාගත හැකි සිද්ධියක් උදා වුවහොත්, රක්ෂණ ආවරණයෙන් ප්‍රතිලාභ ලැබීම සඳහා රක්ෂිතයා විසින් කැපවීමෙන් යුතුව සියලු පශ්චාත්-කොන්ත්‍රාත් කොන්දේසි සපුරාලිය යුතු ය. අනපේක්ෂිත අභියෝග උදාවිය හැකි වුව ද, මනා ණය පාලන යාන්ත්‍රණ, ප්‍රබල ණය රක්ෂණ කාර්ය පටිපාටි, සහ විධිමත් ලේඛනගත කිරීම ඔස්සේ එවැනි අවදානම් බොහෝවිට අවම කරගත හැකි ය. ඔප්පු කොන්දේසි සහ හිමිකම් සලකා බැලීම්වලට අදාළව ඉතා වැදගත් යම් යම් දෑ නිමකළ යුතු කාලසීමා සම්බන්ධයෙන් ඔප්පු හිමියන්ට සිහි කැඳවීම සඳහා යොදාගත හැකි සංවිධානය කළ ක්‍රමයක් ඔස්සේ හිමිකම්වල බලාත්මකතාවය තවදුරටත් වැඩිදියුණු කරනු ලැබේ.

එ.අ.එමීර් රාජ්‍යයේ ගැනුම්කරුවකුගේ විවෘත ගිණුමකට අදාළව ශ්‍රී ලංකා අපනනයන ණය රක්ෂණ සංස්ථාව විසින් M.s Edibles Exports (Pvt) Ltd වෙත හිමිකම් මුදලක් ගෙවන අවස්ථාව

මීට අමතරව, රක්ෂණ ගිවිසුමේ වලංගුබව ආරක්ෂා කරගැනීමට සහ ගොනුකරන ඕනෑම හිමිකමක නීත්‍යානුකූලබව සහතික කිරීම සඳහා වැදගත් කරුණු සම්බන්ධයෙන් කාලානුරූපී සහ නිරවද්‍ය ලිඛිත අනාවරණය කිරීම් ද වැදගත් වේ.

2023 වර්ෂයේ දී වාර්තා කළ රු.මිලියන 40.90ට සාපේක්ෂව, 2024 මූල්‍ය වර්ෂය තුළ පියවනු ලැබූ ශුද්ධ හිමිකම්වල වටිනාකම රු.මිලියන 27.30 ක් වේ.

ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් රු.මිලියන 1,473.17ක වටිනාකමකින් යුතු හිමිකම් ගෙවා තිබෙන අතර, එමගින් ශ්‍රී ලංකාවේ අපනයන අංශය සඳහා සහාය වීමේ සහ වාණිජ අවදානම් අඩු කිරීම සඳහා සංස්ථාවේ ඇති නොසැලෙන කැපවීම පිළිබිඹු වේ. සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ අඛණ්ඩ හා සවිමත් අරමුදල් කළමනාකරණ ක්‍රමෝපාය හේතුවෙන් මෙම හිමිකම් නියමිත කාල සීමා තුළ ගෙවීම සිදුකිරීමට හැකි විය.

පුහුණු සහ සංවර්ධන කටයුතු - 2024

ආයතනික මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය සහතික කිරීම සඳහා සේවකයන්ගේ අඛණ්ඩ සංවර්ධනය වෙනුවෙන් ආයෝජනය කිරීම මූලික වේ. 2024 වර්ෂය මුළුල්ලේ, නිලධාරීන්ට සිය අදාළ කටයුතුවල විශිෂ්ට ආකාරයෙන් නියැලීමට අවශ්‍ය නිපුණතා සහ දැනුම සම්පාදනය කිරීම උදෙසා පුහුණු කටයුතු සඳහා සංවිධානාත්මක ප්‍රවේශයක් ක්‍රියාත්මක කරන ලදී.

බදුකරණය, මූල්‍ය ගිණුම්කරණය, සයිබර් ආරක්ෂාව, ප්‍රවාහන කළමනාකරණය, මෙහෙයුම් අත්පොත් සකස් කිරීම වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරමින් පුළුල් පරාසයක පුහුණු වැඩසටහන් පවත්වන ලදී. විශේෂිත ක්ෂේත්‍රවල විශේෂඥතාවය සවිමත් කිරීම, ඌකියා කාර්යසාධනය වැඩිදියුණු කිරීම, සහ ආයතනය තුළ නවෝත්පාදන වර්ධනය කිරීම මෙම වැඩසටහන් ඔස්සේ අරමුණු විය.

ප්‍රධාන පුහුණු වැඩසටහන් අතරට පහත වැඩසටහන් ඇතුළත් විය:

- ආදායම් බදුවල ප්‍රායෝගික යොදාගැනීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව: ආදායම් බදු නීති පිළිබඳ මූලික දැනීමක් ලබාදීමට මෙම පාඨමාලාව සැලසුම් කරන ලද අතර, මූල්‍ය කටයුතු ආශ්‍රිත රාජකාරිවල නිරතවන නිලධාරීන්ට මෙය ප්‍රයෝජනවත් විය.
- අවදානම් සහ සයිබර් ආරක්ෂාවේ මූලිකාංග පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව: ආයතනය තුළ දත්ත ආරක්ෂාව සහතික කරමින් සයිබර් ආරක්ෂාවට අදාළ තර්ජන සහ ඒවා අවම කිරීමේ ක්‍රමෝපාය පිළිබඳව නිලධාරීන් වෙත දැනුම ලබාදීම මෙමගින් අවධානය යොමුකරන ලදී.
- මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ කෙටි පාඨමාලාව: ගිණුම්කරණයේ නිපුණතාවය සහ මූල්‍ය කළමනාකරණ හැකියා වැඩිදියුණු කිරීම සඳහා මාස තුනක කාල සීමාවක් තුළ පාඨමාලාව පවත්වන ලදී.
- වාහන ඇණි කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව: කාර්යක්ෂම ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත් කරන ලද අතර, සැපයුම් දාම සහ වාහන මෙහෙයුම් අධීක්ෂණයේ නියුතු අංශවලට ප්‍රයෝජනවත් විය.
- බදුකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව: බදුකරණ කාර්යපටිපාටි සහ අනුකූලතාවය පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම පිණිස සැලසුම් කළ සිවු-මාසික සවිස්තරාත්මත වැඩසටහනකි.
- අපනයන ණය රක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන: අපනයන ණය ප්‍රතිපත්ති පිළිබඳ මනා දැනුමක් ලබාදීම පිණිස ජාත්‍යන්තර වෙළඳ මූල්‍ය කටයුතු පිළිබඳ රාජකාරිවල නියැලෙන සේවකයන් සඳහා මෙය පවත්වන ලදී.
- උසස් මට්ටමේ එක්සෙල් සහතිකපත්‍ර පාඨමාලාව: එක්සෙල් ආශ්‍රිත පරිගණක නිපුණතාවලින් සේවකයන් බලගැන්වීම තුළින් දත්ත විශ්ලේෂණය සහ වාර්තා ජනනය කිරීමේ හැකියා වැඩිදියුණු කිරීම.
- ආදායම් බදු වාර්තා ගොනු කිරීම පිළිබඳ පුහුණුව: බදු ගොනු කිරීමේ කාර්යපටිපාටි පිළිබඳ හැකියාවන් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විශේෂිතව සැකසූ වැඩසටහනකි.
- මූල්‍ය කටයුතු ආශ්‍රිත අංශවලින් බැහැර අංශවල සේවයේ නියුතු පිරිස සඳහා මූලික මූල්‍ය දැනුමක් ලබාදීමට සැලසුම්කළ වැඩසටහනකි.
- ගොනු කළමනාකරණය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන: සේවකයන්ගේ ලේඛන කළමනාකරණ කුසලතා මනාව දියුණු කර ආයතනික කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- මෙහෙයුම් අත්පොත් පිළිබඳ වැඩමුළුව: මෙහෙයුම් අත්පොත් සකස් කිරීම සහ සමාලෝචනය කිරීම, විවිධ අංශ හරහා සම්මත කාර්ය පටිපාටි සහතික කිරීම සඳහා රුකුලක් ලබාදීමට පවත්වන ලදී.

- ආසියානු ණය පරිපූරක ආයතනික සන්ධානය (ACSIC) 32 වැනි පුහුණු වැඩසටහන - ජපානය: ගෝලීය ව්‍යාපාරික ප්‍රමිති පිළිබඳ සිය විශේෂඥ දැනුම පුළුල් කරගැනීම සඳහා තෝරාගත් නිලධාරීන් පිරිසක් වෙත ලබාදුන් ජාත්‍යන්තර පුහුණු අවස්ථාවකි.

"මැත කාලීන ආර්ථික තත්ත්වයන් මත පදනම්ව ගනු ලබන සුවිශේෂී පියවර- ණය පරිපූරක ක්‍රම හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා තිරසර සහ මනා පරිචයන් අනුගමනය කිරීම" යන මාතෘකාව යටතේ වැඩසටහන පැවැත්විණි.

අඛණ්ඩ ඉගෙනුම් සහ වෘත්තීය සංවර්ධන සංස්කෘතියක් වර්ධනය කිරීමෙහිලා ආයතනයේ කැපවීම මෙම පුහුණු වැඩසටහන්වලින් පිළිබිඹු විය. කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමෙන්, ආයතනික අභියෝග මඟහරවා ගෙන අර්ථාන්විත අයුරින් ආයතනයේ සාර්ථකත්වය සඳහා දායකවීම සඳහා සේවකයන් හැඩගස්සවනු ලැබේ.

ආයතනික ප්‍රගමනයේ සහ මෙහෙයුම් විශිෂ්ටත්වයේ ප්‍රමුඛස්ථානයේ ආයතනික කාර්ය මණ්ඩලය සිටින බව සහතික කරමින් ආයතනය ඉදිරියට යෑමේ දී, දැනට ක්‍රියාත්මක වන පුහුණු වැඩසටහන් අඛණ්ඩව ප්‍රමුඛතාවයෙන් සලකනු ඇත.

ක්‍රමෝපායික මඟ පෙන්වීම: වර්ධනය, නවෝත්පාදන සහ ආයතනික බලපෑම

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ ක්‍රමෝපායික ප්‍රමුඛතා මගින් අවධානය යොමු කරනුයේ ප්‍රධාන සේවාදායකයන්, එහි නිමැවුම් සමාජයේ විවිධ ස්තර තුළට ඇතුළත් වීම සහ සන්නාම පිළිබඳ දැනුවත්බවයි

- දැනට ක්‍රියාත්මක විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පු හිමිකරුවන් සවිමත් කිරීම: ශ්‍රී ලංකා අපනයන න්‍යාය රක්ෂණ සංස්ථාව විසින් සිය ක්‍රියාවලි අභ්‍යන්තරික වශයෙන් සුසංවිධිත කිරීම සහ සේවාදායකයන් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර එක් එක් සේවාදායකයන්ගේ අවශ්‍යතානුකූලව ලැබෙන සහාය ඔස්සේ දැනට ක්‍රියාත්මක විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පු හිමිකරුවන් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීමට හැකිවනු ඇත.

- නව ව්‍යාපාර ඉලක්ක කිරීම:
විගමනික ශ්‍රමිකයන්ගේ ඉහළ යෑමත් සමඟ, ඇපාරා ඇපකරය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ අවධානයක් යොමු වනු ඇත. සියලු නිමැවුම් ඔස්සේ නව ව්‍යාපාර අවස්ථා ඇති කරගැනීමට හා බැංකු හා මූල්‍ය ආයතන සමඟ ගොඩනැංවී ඇති මූලික සබඳතා ඔස්සේ නව වෙළඳපොළ මාර්ග වෙත විවෘත වීමටත් සැලසුම් කරන්නෙමු.

- නිමැවුම්හි නවෝත්පාදන:
වර්තමාන වෙළඳපොළ අවශ්‍යතාවලට සරිලන පරිදි නව රක්ෂණ සහ ඇපකර නිමැවුම් හඳුන්වාදීම ඔස්සේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ මණ්ඩලය අඛණ්ඩව සිය නිමැවුම් කළඹ වර්ධනය කරගනු ඇත. ආර්ථිකයේ වැදගත් අංගයක් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වෙළඳපොළ ඉලක්ක කරගත් නව නිමැවුමක් සකස් කිරීම සඳහා ප්‍රබල අවධානයක් පවතින අතර එමගින් ජාත්‍යන්තර වෙළඳ කටයුතු සමඟ වැඩි නියුක්තවීමක් අපේක්ෂා කෙරේ.

- සන්නාම වෙරගැන්වීම සහ කලාපීය වශයෙන් ආයතනික බලපෑම: ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සන්නාම, විකුණුම්කරුගේ අවදානම සහ ඇපාරා වෙර ගැන්වීම මූලික ප්‍රයත්නයක් වනු ඇත. අපනයනකරුවන් සහ අපනයන ආශ්‍රිත සේවා සැපයුම්කරුවන් සඳහා සහාය ලබාදීමේ ව්‍යාප්ත කාර්යභාරය අතර, අපගේ සියලු නිමැවුම් හා සේවාවල සන්නාම පිළිබඳ දැනුවත්බව ඵලදායි අයුරින් පුළුල් කිරීම ඔස්සේ ශ්‍රී ලංකාව පුරා විභව්‍ය වෙළඳපොළවල කටයුතු කිරීම.

- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සමඟින් ඉදිරි අපනයන ඉපැයුම් නංවාලීම:ගෝලීය වශයෙන් ආර්ථික අස්ථාවරත්වය තවමත් පවතින නමුදු, සංස්ථාව ධනාත්මක ආකල්පයක පසුවන අතර, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සඳහා සහාය ලබාදීමට කැපවී සිටී. ශ්‍රී ලංකාවේ වෙළඳ ගිණුමේ ශේෂය අවම කිරීම සඳහා භාණ්ඩ හා සේවා අපනයන ඉතා වැදගත් වේ. ආසියාවේ සීඝ්‍රයෙන් නැඟීඑන වෙළඳපොළවල් සහ ගෝලීය වශයෙන් ව්‍යාප්ත අනෙකුත් නැඟීඑන වෙළඳපොළවල අවදානම ද දරා ගනිමින් අවස්ථා උදාකරගැනීමේ අපේක්ෂාව සහිත ව්‍යාපාර සඳහා නොසැලෙන සහායක් අඛණ්ඩව සැපයීම.

ආයතනික යහපාලනය

කාර්යසාධනය වැඩිදියුණු කරමින් සහ ක්‍රමෝපායික ඉලක්ක හා අරමුණු කර ළඟා කරමින් ආයතනික යහපාලනය ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ තිරසර සංවර්ධනයට දායක වනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්වය සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර පවතින සම්බන්ධතා අපගේ ආයතනික යහපාලනයේ දී අවධානයට යොමු කෙරේ.

අභ්‍යන්තර මෙවලම්
- 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ පනත
- අධ්‍යක්ෂ මණ්ඩලය සහ උප කමිටු සඳහා යොමුකිරීමේ අනුදේශ
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති අත්පොත්
- මූල්‍ය බලතල බෙදීයෑම

බාහිර මෙවලම්
- 1971 අංක 28 දරන මුදල් පනත
- යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ
- මහා භාණ්ඩාගාර/ රජයේ චක්‍රලේඛ
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ ආයතනික යහපාලනය සඳහා මනා පරිචයන් පිළිබඳ සංග්‍රහය

ආයතනික සාර්ථකත්වය, තිරසර වර්ධනය සහතික කරන හරයාත්මකබව, විනිවිදබව, වගවීම සම්බන්ධයෙන් සහ ව්‍යවස්ථාපිත සහ නියාමන බැඳීම් සපුරාලීම අපගේ පාලන මූලධර්ම මගින් අවධානය යොමු කෙරේ.

අභ්‍යන්තර සහ බාහිර මෙවලම් තුළ අන්තර්ගත මූලධර්ම සහ අවශ්‍යතා මගින් ආයතනික යහපාලන රාමුව සඳහා මඟ පෙන්වීම ලබාදේ.

පාලනය ප්‍රායෝගික භාවිතයට යොදා ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් ඉටුකරන ක්‍රමය සඳහා අපගේ ප්‍රවේශය ආයතනික යහපාලන මාර්ගෝපදේශ මගින් දක්වනු ලැබේ.



අධ්‍යක්ෂ මණ්ඩලය

ක්‍රමෝපායික, මූල්‍ය සහ කීර්ති නාමය සම්බන්ධයෙන් තීරණ ගනු ලබන සංස්ථාවේ ප්‍රධාන මෙහෙයුම් බලය අධ්‍යක්ෂ මණ්ඩලය යි.

රාජකාරි ඉටුකිරීම සම්බන්ධිත ආකල්ප, එහි හරයාත්මක අගයන් සහ නිරන්තරයෙන් පරීක්ෂා කරන හා වැඩිදියුණු කරන වගවීම හා විනිවිදබව පිළිබඳ සවිමත් රාමුවක් තුලින් පිළිබිඹු වන යහපාලන සංස්කෘතියක් මණ්ඩලය විසින් සහතික කෙරේ.

අධ්‍යක්ෂවරුන් ස්වාධීනත්වය

මණ්ඩලය සභාපති සහ කළමනාකාරවරයාගෙන් සමන්විත වන අතර අධ්‍යක්ෂ සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ස්වාධීන වන අතර ඔවුන්ගේ ස්වාධීන විනිශ්චයේ තීරණවලට සැලකිය යුතු ලෙස බලපෑ හැකි කිසිදු ව්‍යාපාරයකින් හෝ වෙනත් සම්බන්ධතාවයකින් තොරය.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසයකට වරක් පැවැත්වෙන අතර විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවශ්‍යතාවය පරිදි කැඳවනු ලැබේ. ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෝ ආරාධනා කිරීම මත රැස්වීම සඳහා වෙති. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විධිමත් න්‍යාය පත්‍රයකට අනුව පැවැත්වෙන අතර අධ්‍යක්ෂවරු සඳහා රැස්වීමට පූර්වයෙන් ආයතනික කළමනාකාරිත්වය විසින් අදාළ සවිස්තරාත්මක පසුබිම් තොරතුරු ලබාදෙනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වන ලදී.

ඵලදායී තීරණ ගැනීමේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම හෝ උප-කමිටු රැස්වීම්වලට අදාළව ආයතනික කළමනාකාරිත්වය විසින් සහ අවශ්‍ය වුවහොත්, බාහිර විශේෂඥ දැනුමෙන් හෙබි තැනැත්තන්/ වෘත්තිකයන් විසින් අධ්‍යක්ෂවරු වෙත සියලු තොරතුරු සපයනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ කේවල සහ සාමූහික වගකීම් ඵලදායී අයුරින් ඉටු කිරීමට හැකිවන පරිද්දෙන් යෝග්‍ය තොරතුරු සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා සිටින තොරතුරු නිසි වේලාවට ඔවුන් වෙත ලබාදීම සඳහා ආයතනික කළමනාකාරිත්වය වගකියනු ලැබේ.

සභාපතිගේ කාර්යභාරය

මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට සහ පාලනයට යටත්ව, සංස්ථාවේ කටයුතු මෙහෙයවීම, සංවිධානය, සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය හා කාර්යය ඉටුකිරීම, සහ සංස්ථාවේ සේවකයන්ගේ පරිපාලනය යන මේවා සභාපති භාරයේ පැවතිය යුතු ය.

පනත මගින් සභාපති වෙත පැවරෙන හෝ නියම කෙරෙන හෝ භාර කෙරෙන යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් යම් සේවකයෙකුට පවරා දීම අවශ්‍ය යැයි සභාපති විසින් සලකන කවර අවස්ථාවක වුව ද, මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඔහු විසින් ඒ සේවකයාට ලියවිල්ලකින් එසේ පවරා දිය හැකි අතර සභාපතිගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒ සේවකයා විසින් ඒ බලය ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය හෝ කාර්යය ඉටු කිරීම කළ යුතු ය.

උප කමිටු

B අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඵලදායී අයුරින් ඉටු කිරීමට විශේෂිත කාර්යයන් සඳහා සහාය වීම පිණිස මණ්ඩලයේ උප කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටවනු ලැබේ.

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය නිපුණතා සහ විශේෂඥ දැනුමෙන් හෙබි විධායක-නොවන අධ්‍යක්ෂවරු විගණන කමිටුවට නම්කරනු ලබන අතර, කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය. සිය අනාවරණය කරගැනීම් සහ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන විගණන කමිටුවේ ප්‍රධාන වගකීම වනුයේ මූල්‍ය වාර්තාකරණයේ සහ විගණන කාර්ය පටිපාටිවල අවංකභාවය මෙන්ම, සවිමත් අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති පවත්වාගෙන යෑම සහතික කිරීම යි.

විගණන කමිටුවේ කාර්යය පහත පරිදි වේ,

අධ්‍යක්ෂ මණ්ඩලයට පහත කරුණු සම්බන්ධයෙන් සිය වගකීම ඉටු කිරීම සඳහා සහාය ලබාදීම යි;

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් හෙළිදරවු කිරීම් සිදුකිරීම.
- මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, සංස්ථාපනය කිරීමේ පනත, සමාගම් පනත, සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණය හා සම්බන්ධිත රෙගුලාසි සහ අවශ්‍යතා අනුව තොරතුරු අවශ්‍යතාවලට අනුකූලතාවය.
- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල අවශ්‍යතා සපුරාලීම සඳහා අස්තිත්වයේ අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ කාර්ය පටිපාටි ප්‍රමාණවත්බව සහතික කිරීම සඳහා ක්‍රියාවලිය.
- අස්තිත්වයේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්ය සාධනය සහතික කිරීම.
- අවදානම් කමිටුවක් නොමැති අවස්ථාවන්හි දී, සුවිශේෂී ව්‍යාපාරික/ මූල්‍ය අවදානම් හඳුනාගැනීම, අධීක්ෂණය සහ කළමනාකරණය.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිස්වල ආශ්‍රිත පාර්ශව ගනුදෙනු වාර්තා කිරීම.

කමිටුවේ සංයුතිය

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි කමිටු සාමාජිකයන් වශයෙන් විධායක-නොවන අධ්‍යක්ෂවරු පත්කරන ලදී.

- ඒ.ඒ.අයි.දිල්රුක්ෂි මෙය - විගණන කමිටුවේ සභාපති (කාල සීමාව - 2024 සමස්ත වර්ෂය පුරා)
- ප්‍රියන්ත පෙරේරා - සාමාජික (කාල සීමාව - 2024 සමස්ත වර්ෂය පුරා)
- බී.එම්.එස්.බණ්ඩාර මෙය - සාමාජික (කාල සීමාව - 2024 වර්ෂයේ පළමු මාස 06)
- අරවින්දි ද සිල්වා මෙය - සාමාජික (කාල සීමාව - 2024 වර්ෂයේ දෙවන මාස 06)

වගකීම්, අධිකාරියේ විෂය පථය සහ විගණන කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වා ඇති විශේෂිත වගකීම් අන්තර්ගත කිරීම පිණිස කමිටුවේ ප්‍රඥප්තිය ස්ථාපනය කර තිබේ.

රැස්වීම්

යථෝක්තව දක්වා ඇති පරිදි කමිටුව වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

කමිටුව විසින් ඉටුකරන ලද කාර්යයන්

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා යොදාගෙන ඇති මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සංගතභාවය සහ හෙළිදරවු කිරීම් සහ අනෙකුත් නියාමන අවශ්‍යතා ද ඇතුළුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා යොදාගන්නා SLFRS/LKAS ඇතුළුව මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයේ අනුකූලතාවය කමිටුව විසින් සහතික කරන ලදී. සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්බව, කාල රාමුව සහ ඉදිරිපත් කිරීම් ද කමිටුව විසින් පරීක්ෂා කරන ලදී. ඉහත දක්වා ඇති කටයුතු හැරුන විට, කමිටුවේ වගකීම් සාර්ථක අයුරින් සම්පූර්ණ කිරීම පිණිස පහත කාර්යයන් ද නිමා කරන ලදී.

- 2024 වර්ෂයේ ඉදිරිපත් කරන ලද විගණන වාර්තාවල සාරාංශය පරීක්ෂා කරන ලදී (විගණන වාර්තා 10)
- 2024 වර්ෂයේ ඉදිරිපත් කරන ලද සමාලෝචනය කළ විගණන වාර්තාවල සහ විශේෂ විමර්ශන වාර්තාවල සාරාංශය පරීක්ෂා කිරීම.
- 2025 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර අනුමත කරන ලදී.
- මූල්‍ය රෙගුලාසි 135 යටතේ බලය පැවරීම, 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම, සංස්ථාවේ අයවැය සහ ප්‍රසම්පාදන සැලැස්ම සමාලෝචනය කිරීම.
- 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සහ ගිණුම්කරන ප්‍රතිපත්ති SLFRS සහ LKAS ප්‍රකාරව සිදුකිරීම අවශ්‍ය කරන නිවැරදි කිරීම් සමාලෝචනය කිරීම.
- අවදානම් විශ්ලේෂණය සහ අභ්‍යන්තර විගණක විසින් මතුකර දැක්වූ අදාළ දුර්වලතා ක්ෂේත්‍ර සඳහා වන අවම කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සහ අවශ්‍ය පියවර ගැනීම සඳහා විගණන කමිටුවේ නිර්දේශ කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීම.
- 2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන විගණකාධිපතිවරයාගේ වාර්තාව සමාලෝචනය කර එහි විශේෂයෙන් මතුකර ඇති ගැටලුවල වර්තමාන තත්ත්වය සාකච්ඡා කිරීම.
- වර්ෂය තුළ පැන නැඟුනු අනෙකුත් මෙහෙයුම් සහ අනුකූලතා ගැටලු සමාලෝචනය කිරීම.
- මූල්‍ය, මෙහෙයුම්, පාලන සහ රක්ෂණ ගැටලු සම්බන්ධයෙන් කමිටු සාමාජිකයන්ගේ සිය පුද්ගලික මෙන්ම සාමූහික අත්දැකීම් ඔවුන්ට සිය වගකීම් ඵලදායි අයුරින් ඉටුකිරීම සඳහා උපකාරී විය.

අභ්‍යන්තර විගණන කාර්යය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සාධාරණීය සහතිකකිරීමක් ලබාදීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවල සඵලතාවය ඇගයීම, අවදානම් ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ ගනුදෙනුවල නිරවද්‍යතාවය හා පරිපූර්ණතාවය සත්‍යාපනය කිරීම අභ්‍යන්තර විගණනයේ භූමිකාව වේ.

අභ්‍යන්තර විගණන අංශය විසින් පිළියෙල කළ විගණන සැලැස්ම වර්ෂය ආරම්භයේ දී ම විගණන කමිටුව විසින් අනුමත කරනු ලබන අතර, සංස්ථාවේ වත්කම් ආරක්ෂා කරගැනීම පිණිස අභ්‍යන්තර පාලන ක්‍රමවේද නිසි පරිදි ඇත්දැයි සහතික කිරීම පිණිස විගණන වාර්තාවල සාරාංශය ඇගයීම සිදුකෙරේ. ඉහත කරුණු හැරුනවිට, නිරීක්ෂණ සහ යෝජනා ලබාදීම පිණිස කළමනාකාරිත්වය විසින් නියෝග කරන පරිදි විශේෂ විමර්ශනයන් ද සිදුකරනු ලැබේ. විගණන නිර්දේශ ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා නිශ්චිත කාලාන්තරවලදී සමාලෝචන සැලසුම් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණනය විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉටුකළ කාර්යයන්ගේ සාරාංශය.

- අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්බව සමාලෝචනය කර පවතින දුර්වලතා නිවැරදි කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන ලදී.
- 2024 වර්ෂයේ අනුමත විගණන සැලැස්මට අනුව කොටස් වශයෙන් විගණන 12ක් සිදුකළ අතර, හඳුනාගත් ප්‍රධාන ගැටලු සම්බන්ධයෙන් වාර්තා 10ක් නිකුත් කරන ලදී.
- විගණන කමිටු රැස්වීමේ දී අභ්‍යන්තර විගණන වාර්තා සාකච්ඡා කරන ලදී.
- විගණකාධිපති වාර්තාව සහ එම වාර්තාව මගින් අනාවරණය වූ කරුණුවල වර්තමාන තත්ත්වය සාකච්ඡා කරන ලදී.
- ක්‍රියාත්මක කළ අභ්‍යන්තර පාලන සඳහා සමාලෝචන විගණන සිදුකරන ලදී.
- කළමනාකාරිත්වයෙන් ලැබූ උපදෙස් පරිදි විශේෂ විමර්ශන දියත් කරන ලදී.

නිගමනය

සංස්ථාවේ කටයුතු එහි දක්වා ඇති ප්‍රතිපත්ති සහ කාර්ය පරිපාටි අනුව කළමනාකරණය වන බවට සංස්ථාවේ අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් සාධාරණ සහතික කිරීමක් ලබාදෙන බව විගණන කමිටුවේ විශ්වාසය යි.

....

ඒ.ඒ.අයි.දිල්රුක්ෂි

සභාපති

විගණන කමිටුව

2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශ

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

2024 දෙසැම්බර් 31 වැනි දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)		සටහන්	ප්‍රවර්තන වර්ෂය 2024	පූර්ව වර්ෂය 2023
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත සහ උපකරණ		9	136,566,769	146,557,087
දිගු කාලීන මූල්‍ය ආයෝජන (වසර 1කට වඩා වැඩි)		10	97,664,710	384,466,868
මුළු ජංගම නොවන වත්කම්			**234,231,479**	**531,023,954**
ජංගම වත්කම්				
ලිපිද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය තොග			818,264	204,263
ආයෝජන අරමුදල			65,589	2,397,029
වෙළඳ ණයගැති පාලන ගිණුම			26,237,150	11,699,906
විවිධ ණයකරුවෝ, තැන්පතු සහ පූර්ව ගෙවීම්		11	20,619,480	34,047,683
ලැබිය යුතු පොළී ආදායම		12	279,322,104	432,894,859
කෙටි කාලීන මූල්‍ය ආයෝජන (වසර 1කට වඩා අඩු)		13	5,049,044,158	4,523,054,416
විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් වූ ඉතිරි කිරීමේ ගිණුම්		14	9,070,440	9,881,383
මුදල් හා මුදල් සමාන දෑ		15	36,328,560	16,432,199
මුළු ජංගම වත්කම්			**5,421,505,745**	**5,030,611,739**
මුළු වත්කම්			**5,655,737,224**	**5,561,635,694**
හිමිකම්				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	(පිටු අංක 04)		150,000,000	150,000,000
සංචිත	(පිටු අංක 04)		2,332,949,978	2,320,481,939
රඳවාගත් ඉපැයුම්	(පිටු අංක 04)		2,307,804,460	1,895,167,402
මුළු හිමිකම්			**4,790,754,438**	**4,365,649,342**
වගකීම්				
ජංගම නොවන වගකීම්				
ගෙවිය යුතු කාර්ය මණ්ඩල පාරිතෝෂික		16	12,613,898	13,466,484
මුළු ජංගම නොවන වගකීම්			**12,613,898**	**13,466,484**
ජංගම වගකීම්				
විවිධ ණය හිමියෝ, උපචිත වියදම් හා ප්‍රතිපාදන		17	616,526,789	661,752,728
ගෙවීමට තිබෙන හිමිකම් සඳහා ප්‍රතිපාදන		18	232,882,057	517,807,098
ලැබී ඇති වාරික අත්තිකාරම්			2,960,041	2,960,041
මුළු ජංගම වගකීම්			**852,368,887**	**1,182,519,868**
මුළු වගකීම්			**864,982,786**	**1,195,986,352**
මුළු වගකීම් හා හිමිකම්			**5,655,737,224**	**5,561,635,694**
			-	-

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබේ.

....

රවීන් මීවිටිගල

සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් වශයෙන් පවතී.
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.
මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබනු ලැබේ.

මහාචාර්ය (ආචාර්ය) අරුණ ශාන්තආරච්චි

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ | **අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂ**

2025 පෙබරවාරි 27

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)	සටහන්	ප්‍රවර්තන වර්ෂය 2024	පූර්ව වර්ෂය 2023
ආදායම			
දළ ලිඛිත වාරික	1	594,900,235	411,935,492
උපයා නොගත් වාරික සඳහා සංචිතයේ ශුද්ධ වෙනස	1අ	(7,705,306)	6,590,611
දළ උපයාගත් වාරික		**587,194,928**	**418,526,103**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	2	17,041,005	15,251,796
මෙහෙයුම්වලින් ලද මුළු ශුද්ධ ආදායම		**604,235,933**	**433,777,899**
අනෙකුත් ආදායම්			
ආයෝජන ආදායම	3	498,216,671	787,110,607
		498,216,671	**787,110,607**
මුළු ශුද්ධ ආදායම		**1,102,452,604**	**1,220,888,505**
හිමිකම් සහ මෙහෙයුම් වියදම්			
ශුද්ධ හිමිකම්	4	104,707,592	62,831,747
තත්ත්ව වාර්තා		7,497,485	6,422,511
ආයතනික වියදම්	5	27,781,934	25,104,920
පරිපාලන වියදම්	6	93,695,505	61,029,577
විකුණුම් හා අලෙවිකරණ වියදම්	7	16,345,789	9,679,877
මූල්‍ය ගාස්තු	8	460,718	196,844
ශුද්ධ හිමිකම් සහ මෙහෙයුම් වියදම්		**250,489,023**	**165,265,476**
එකතු කළ අගය මත බද්දට පෙර ලාභය/ අලාභය		851,963,580	1,055,623,029
මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද	8අ	-	-
ආදායම් බද්දට පෙර ලාභය		**851,963,580**	**1,055,623,029**
ආදායම් බදු	8ආ	270,088,617	281,575,841
බදු පසු ලාභය		**581,874,963**	**774,047,188**
අනෙකුත් ආදායම්/වියදම්			
විනිමය අනුපාතික වෙනස්වීම හේතුවෙන් ලාභය/(අලාභය)		(259,260,836)	(294,017,104)
බදු පසු මුළු විස්තීර්ණ ආදායම		**322,614,127**	**480,030,084**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව		
2024 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	ප්‍රවර්තන වර්ෂය	පූර්ව වර්ෂය
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)	**2024**	**2023**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
බදු පෙර ශුද්ධ ලාභය	851,963,580	1,055,623,029
ගැලපුම් කළා ;		
ක්ෂය කිරීම්	13,829,333	16,346,130
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,352,124	2,401,583
හිමිකම් සඳහා ප්‍රතිපාදන	104,707,592	166,611,769
නොඉපැයූ වාරික සඳහා ගැලපුම්	(7,705,306)	(6,590,611)
විදේශ විනිමය අනුපාතික ඔස්සේ ලාභය	-	-
පූර්ව වර්ෂ ගැලපුම්	377,862,792	(569,757,611)
ආයෝජන ආදායම්	(498,216,671)	(787,110,607)
ඉදිරි හිමිකම් සඳහා ප්‍රතිපාදන	(284,925,041)	21,929,171
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**560,868,403**	**(100,547,147)**
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(14,537,244)	6,074,509
තැන්පතු හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම	(13,428,203)	(284,885,251)
වෙළඳ ණයහිමි සහ අනෙකුත් ගෙවිය යුතු වැඩිවීම/(අඩුවීම)	(45,404,439)	424,027,772
පාරිභෝගිකයන් වෙතින් රඳවාගත් නැවත ගෙවිය යුතු තැන්පතු වැඩිවීම/(අඩුවීම)	(178,500)	452,800
තොග අඩුවීම/ (වැඩිවීම)	(614,002)	617,972
මෙහෙයුම්වලින් ජනනය වූ/ (භාවිතා වන) මුදල්	**486,706,015**	**45,740,655**
පාරිතෝෂික ගෙවීම	(4,976,040)	(2,568,771)
හිමිකම් ගෙවීම	(26,958,061)	(40,574,275)
මූල්‍ය සේවා මත ගෙවූ වැට් බද්ද	-	(7,858,426)
ගෙවූ ආදායම් බදු	296,144,876	(147,945,211)
භාණ්ඩාගාරය වෙත ලෙවූ විශේෂ බද්ද	(265,000,000)	(500,000,000)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද/ (භාවිතා වන) ශුද්ධ මුදල්	**485,916,790**	**(653,206,029)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	3,839,015	(11,775,880)
පොලී ආදායම්	498,216,671	787,110,607
ස්ථිර තැන්පතු	(968,076,115)	(137,873,466)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද/ (භාවිතා වන) ශුද්ධ මුදල්	**(466,020,429)**	**637,461,261**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ		
ලැබූ භාණ්ඩාගාර ණය මුදල/ නැවත ගෙවීම්	-	-
ප්‍රාග්ධන දායකත්වය	-	-
ණය ආපසු ගෙවීම	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද/ (භාවිතා වන) ශුද්ධ මුදල්	**-**	**-**
මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම	**19,896,361**	**(15,744,769)**
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)	16,432,199	32,176,968
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)	**36,328,560**	**16,432,199**
සටහන අ		
මුදල් හා මුදල් සමාන දෑ		
හැටන් නැෂනල් බැංකුවේ ජංගම ගිණුම්	11,557,103	955,761
හැටන් නැෂනල් බැංකුවේ හර බද්දෙන් නිදහස් ජංගම ගිණුම	1,468,526	605,802
හැටන් නැෂනල් බැංකුවේ ඒක්ෂණ තැන්පතු ගිණුම	13,428,928	13,428,928
ලංකා බැංකුවේ ජංගම ගිණුම	8,254,923	1,325,877
මහජන බැංකුවේ ජංගම ගිණුම	1,611,525	113,831
ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ජංගම ගිණුම	5,555	-
අතැති මුදල්	2,000	2,000
	36,328,560	**16,432,199**

2024 දෙසැම්බර් 31 වැනි දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

විස්තරය	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවාගත් ආදායම්	පොදු සංචිතය	ප්‍රත්‍යාගණනිත සංචිතය	ආයෝජන අරමුදල	නොඉපයූ වාරික	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2023 ජනවාරි 01 දිනට ශේෂය	30,000,000.00	2,284,894,930.26	2,107,589,464.84	137,308,408.27	58,507,949.05	23,666,728.29	4,641,967,480.71
ප්‍රත්‍යාගණනිත සංචිතයෙන් මාරු කරන ලද	-	-	13,291,520.00	(13,291,520.00)	-	-	-
භාණ්ඩාගාර ආයෝජන	120,000,000.00	-	-	-	-	-	120,000,000.00
පූර්ව වර්ෂ ගැලපුම්	-	(569,757,611.38)	-	-	-	-	(569,757,611.38)
2023 වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	480,030,083.55	-	-	-	-	480,030,083.55
2023 වර්ෂය තුළ මාරු කරන ලද	-		-	-	-	(6,590,611.36)	(6,590,611.36)
2023 වර්ෂය සඳහා විශේෂ බද්ද	-	(300,000,000.00)	-	-	-	-	(300,000,000.00)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	150,000,000.00	1,895,167,402.43	2,120,880,984.84	124,016,888.27	58,507,949.05	17,076,116.93	4,365,649,341.52
ප්‍රත්‍යාගණනිත සංචිතයෙන් මාරු කරන ලද	-	-	-	-	-	-	-
භාණ්ඩාගාර ආයෝජන	-	-	-	-	-	-	-
ගැලපුම්	-	377,862,791.81	-	-	-	-	377,862,791.81
2024 වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	322,614,126.91	-	-	-	4,762,732.22	327,376,859.13
2024 වර්ෂය තුළ මාරු කරන ලද	-	-	-	-	-	-	-
2024 වර්ෂය සඳහා විශේෂ බද්ද	-	(287,839,861.24)	-	-	-	7,705,306.49	(280,134,554.75)
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	150,000,000.00	2,307,804,459.91	2,120,880,984.84	124,016,888.27	58,507,949.05	29,544,155.64	4,790,754,437.71

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
2024 දෙසැම්බර් **31** වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

සටහන			ප්‍රවර්තන වර්ෂය **2024**	පූර්ව වර්ෂය **2023**
1	දළ ලිඛිත වාරික			
	පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකර		-	450,000.00
	පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකර		474,241.60	468,737.70
	අපනයන කාර්යසාධන ඇපකර		3,184,000.00	2,181,000.00
	ගුවන් ගමන් වියදම් සඳහා ඇපකර (ඇපාරා)		234,389,910.93	79,993,105.14
	අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු (විකුණුම්කරුගේ අවදානම්)		356,852,082.42	328,842,648.83
			594,900,234.95	**411,935,491.67**
	උපයා නොගත් වාරිකවල (වැඩිවීම)/ අඩුවීම	**1a.**	(7,705,306.49)	6,590,611.36
	දළ ඉපැයූ වාරික		**587,194,928.46**	**418,526,103.03**
1අ	උපයා නොගත් වාරික			
	අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පුවල දළ උපයා නොගත් වාරික			
	ජනවාරි 1 දිනට ශේෂය		14,279,450.46	23,170,908.10
	වසර තුළ දී ප්‍රකාශිත වාරික		356,852,082.42	328,842,648.83
	වසර තුළ දී උපයාගත් වාරික		353,391,211.58	337,734,106.47
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**17,740,321.30**	**14,279,450.46**
	ණය ඇපකරවල දළ උපයා නොගත් වාරික			
	ජනවාරි 1 දිනට ශේෂය		2,796,666.48	495,820.20
	වසර තුළ දී ප්‍රකාශිත වාරික		238,048,152.53	83,092,842.84
	වසර තුළ දී උපයාගත් වාරික		233,803,716.88	80,791,996.56
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**7,041,102.13**	**2,796,666.48**
	දෙසැම්බර් 31 දිනට මුළු සංචිත		24,781,423.43	17,076,116.94
	ජනවාරි 1 දිනට මුළු සංචිත		17,076,116.94	23,666,728.30
	උපයා නොගත් වාරික සංචිතයේ ශුද්ධ වෙනස		**7,705,306.49**	**(6,590,611.36)**
2	අනෙකුත් මෙහෙයුම් ආදායම්			
	ඇපකර, ඔප්පු, පරිපාලන, සැකසුම් හා ගැනුම්කරු වගකීම් සීමා		17,012,761.97	15,147,115.00
	BizInfo ආදායම්		28,242.55	104,680.61
			17,041,004.52	**15,251,795.61**
3	ආයෝජන ආදායම්			
	භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර		26,104,916.26	28,045,523.55
	රක්ෂණ තැන්පතු		-	489,268.11
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතු		23,598.01	22,838.62
	ස්ථාවර තැන්පතු (එක්සත් ජනපද ඩොලර්)		179,070,836.03	267,416,944.68
	ඉතුරුම් (එක්සත් ජනපද ඩොලර්)		119,342.38	531,397.83
	ස්ථාවර තැන්පතු (යුරෝ)		3,675,363.38	7,476,874.89
	ලාභාංශ		-	-
	ස්ථාවර තැන්පතු (රුපියල්)		287,692,284.61	480,500,950.81
	ආයෝජන අරමුදල මත පොලිය		66,336.90	1,492,150.68
	කාර්ය මණ්ඩල ණය මත පොලිය		92,417.06	62,911.23
	පාරිතෝෂික අරමුදල මත භාණ්ඩාගාර බිල්පත් පොලිය		1,367,283.73	1,067,711.70
	පාරිතෝෂික ඉතිරුම් ගිණුම් මත පොලිය		-	-
	විවිධ ආදායම්		4,292.44	4,034.69
			498,216,670.80	**787,110,606.79**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)

සටහන				ප්‍රවර්තන වර්ෂය 2024	පූර්ව වර්ෂය 2023
4	ගෙවන ලද ශුද්ධ හිමිකම්				
	වර්ෂය අවසානයේ දී හිමිකම් සඳහා වෙන් කිරීම් - නිශ්චිත			232,882,057.32	452,510,347.07
	පසුගිය වර්ෂවල දී ලබාදුන් හිමිකම්			116,531,742.27	391,976,133.00
	වර්ෂය තුළ දී හිමිකම්			**116,350,315.05**	**60,534,214.07**
	අඩුකළා: පෙර වර්ෂයේ සිදුකරන ලද අතිරික්ත වෙන් කිරීම්			(8,281,487.71)	(2,297,532.89)
	වර්ෂය සඳහා ශුද්ධ හිමිකම්- නිශ්චිත			**108,068,827.34**	**62,831,746.96**
	ගැලපුම් 2024			(3,361,232.79)	103,780,022.24
				104,707,594.55	**166,611,769.20**
5	ආයතනික වියදම්				
	වරිපනම්			990,990.00	990,990.00
	ජල බිල්පත්			317,949.84	177,392.79
	විදුලිය			1,395,047.44	859,908.55
	දුරකතන			551,198.98	570,922.34
	ඊ-මේල් හා අන්තර්ජාල, වෙබ් අඩවිය			457,458.60	452,811.32
	ආරක්ෂක සේවා			768,219.61	671,180.28
	ක්ෂය කිරීම් -	ගොඩනැගිලි		8,825,000.04	8,825,000.00
		මෝටර් වාහන		4,475,922.81	4,332,000.00
		කාර්යාල උපකරණ		233,749.29	145,046.07
		පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර		2,604,978.06	2,604,978.06
		ගෘහ භාණ්ඩ හා සවි කිරීම්		250,534.59	231,249.35
		මෘදුකාංග		207,856.25	207,856.25
	රක්ෂණය -	ගොඩනැගිල්ල - කාර්යාල පරිශ්‍රය (නවම් මාවත)		65,505.51	217,568.74
		මෝටර් වාහන		107,529.07	242,238.12
		කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්		10,693.07	27,666.19
		සේවාලාභීන් වෙනුවෙන් ලබාගන්නා රක්ෂණය		40,735.21	-
		මුදල් සඳහා වන සියලු හානි හා පාඩු වෙනුවෙන් ලබාගත් රක්ෂණය		2,965.06	-
		සංචාර රක්ෂණය		11,774.16	-
	අලුත්වැඩියා සහ නඩත්තු -		ගොඩනැගිල්ල	1,257,585.95	1,195,059.53
			මෝටර් වාහන	1,577,717.30	1,248,584.00
			කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ	75,271.41	473,012.15
			පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	3,004,638.40	629,183.78
			මෘදුකාංග	548,613.18	1,002,272.35
				27,781,933.83	**25,104,919.87**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව			
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන			
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්		ප්‍රවර්තන වර්ෂය	පූර්ව වර්ෂය
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)		**2024**	**2023**
සටහන			
6	**පරිපාලන වියදම්**		
	වැටුප් හා දීමනා	40,521,196.35	23,171,743.81
	අනෙකුත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	20,086,199.52	18,230,029.82
	බඳවා ගැනීම්, දේශීය පුහුණු හා අධ්‍යාපන ආයතන සඳහා දායකත්ව මුදල්	2,137,401.06	1,765,047.51
	තේ පැන් හා ආශ්‍රිත වියදම්	1,358,152.05	1,001,906.35
	සේවක අර්ථසාධක අරමුදල	8,090,173.45	4,897,171.72
	සේවක භාරකාර අරමුදල	1,025,445.10	667,039.42
	පාරිතෝෂික	3,352,124.08	2,401,583.33
	අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු	350,000.00	390,000.00
	ගමන් වියදම්, ප්‍රවාහන හා යැපීම්	436,946.79	408,822.81
	තැපැල් ගාස්තු	282,285.52	66,219.48
	වාර්ෂික වාර්තාව හා අනෙකුත් මුද්‍රණ කටයුතු	982,072.60	455,100.00
	කාර්ය මණ්ඩල ණය කපා හැරීම්	-	111,115.44
	ලිපිද්‍රව්‍ය	669,466.90	1,337,437.21
	ඉන්ධන	150,427.80	993,223.56
	බාහිර විගණන ගාස්තු	5,230,000.00	1,295,000.00
	Cloud Backup ගාස්තු සහ වෙබ් අඩවිය හා විද්‍යුත් තැපැල ආදිය පවත්වාගෙන යෑම	696,580.65	682,815.95
	වෘත්තීය, නෛතික සහ උපදේශක ගාස්තු	1,390,000.00	1,068,453.79
	පොදු වියදම්	762,154.33	236,693.75
	මුද්දර ගාස්තු	126,050.00	23,490.00
	ප්‍රවෘත්ති පත්‍ර, පොත් සහ සඟරා	11,110.00	0.00
	සංවත්සර කටයුතු වියදම්	1,935,287.00	720,544.00
	වාර්ෂික වාරිකය	1,022,540.00	854,766.80
	ජීවිත රක්ෂණ	552,065.87	251,372.74
	විදේශීය පුහුණු	2,072,465.32	-
	විනෝදාස්වාද වියදම්	455,360.87	-
		93,695,505.26	**61,029,577.49**
7	**විකුණුම් හා අලෙවිකරණ වියදම්**		
	ප්‍රවර්ධන සහ ව්‍යාපාර සංවර්ධන වියදම්	2,088,203.55	1,129,211.67
	වෙළඳ ප්‍රචාරණය	3,240,196.65	1,356,535.00
	මුද්‍රණ වියදම් - ප්‍රචාරක පත්‍රිකා, ෆෝරම, අයදුම්පත්‍ර ආදිය සඳහා	-	86,940.00
	භාෂා පරිවර්තන ගාස්තු	41,095.00	59,075.00
	ඉන්ධන වියදම්	1,012,410.80	189,185.44
	ආයතනික සාමාජිකත්වයන්	262,591.00	241,530.00
	අන්තර්ජාතික වෘත්තීය සහ අපනයන ආශ්‍රිත සංවිධාන සඳහා දායකත්ව මුදල්	6,338,798.58	5,782,400.00
	අනුග්‍රාහකත්වයන්	2,400,000.00	835,000.00
	බැංකු/ අපනයනකරුවන් සඳහා හිමිදුවීම් සංවර්ධන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්	962,493.64	-
		16,345,789.22	**9,679,877.11**
8	**මූල්‍ය ගාස්තු**		
	බැංකු ගාස්තු	58,977.11	168,133.56
	මුද්දර බදු	-	28,710.00
	සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	401,741.33	-
		460,718.44	**196,843.56**
8අ	මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද		
	අදාළ පනතේ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය සේවා මත එකතු කළ බද්ද මෙම සංස්ථාවට අදාළ නොවේ.		
8ආ	ආදායම් බදු		
	2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතේ විධිවිධාන ප්‍රකාරව, 2024/2025 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද සඳහා අදාළ අනුපාතිකය 30% කි.		

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව					
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන					
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්				ප්‍රවර්තන වර්ෂය	පූර්ව වර්ෂය
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)				2024	2023
9	**දේපළ, පිරියත සහ උපකරණ**				
		Cost as at	Additions/Transfers	(Disposals)/Transfers	Cost as at
	9.1 දළ ධාරණ අගය	01-Jan-2024			31-Dec-2024
	ගොඩනැගිලි	176,500,000.00	-	-	**176,500,000.00**
	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	2,321,994.75	624,383.75	-	**2,946,378.50**
	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	15,884,364.57	-	-	**15,884,364.57**
	කාර්යාල උපකරණ	1,831,242.58	1,969,801.47	-	**3,801,044.05**
	මෝටර් වාහන	21,660,000.00	1,244,830.00	-	**22,904,830.00**
		218,197,601.90	**3,839,015.22**	-	**222,036,617.12**
	9.2 ක්ෂය කිරීම	Balance as at	Charge for the	Disposals/Error	Balance as at
		01-Jan-24	year/Transfers	Correction/Transfers	31-Dec-2024
	ගොඩනැගිලි	52,950,000.00	8,825,000.04	-	**61,775,000.04**
	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,073,360.86	250,534.59	79,288.15	**1,244,607.30**
	පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	8,069,430.39	2,604,978.06	2,590,059.17	**8,084,349.28**
	කාර්යාල උපකරණ	1,451,299.08	233,749.29	99,360.53	**1,585,687.84**
	මෝටර් වාහන	8,664,000.00	4,475,922.81	-	**13,139,922.81**
		72,208,090.33	16,390,184.79	2,768,707.85	85,829,567.27
	ශුද්ධ වටිනාකම	**145,989,511.57**			**136,207,049.85**
	සටහන - 9-අ අස්පෘශ්‍ය වත්කම්				
	මෘදුකාංග	7,504,374.77	-	-	**7,504,374.77**
		7,504,374.77	-	-	**7,504,374.77**
	ක්‍රමක්ෂය				
	මෘදුකාංග	6,936,799.73	207,856.25	-	**7,144,655.98**
		6,936,799.73	**207,856.25**	-	**7,144,655.98**
	ශුද්ධ වටිනාකම	**567,575.04**			**359,718.79**
	මුළු දේපළ, පිරියත සහ උපකරණ	**146,557,086.61**			**136,566,768.64**
10	දිගු කාලීන ආයෝජන				
	ඉන්ග්‍රින් සමාගමේ කොටස්			10.00	10.00
	ණය තොරතුරු කාර්යාංශයේ කොටස්			123,700.00	123,700.00
	භාණ්ඩාගාර බැඳුම්කර			97,541,000.00	8,089,500.00
	රුපියල්වලින් පවතින ස්ථාවර තැන්පතු			-	376,253,657.81
				97,664,710.00	**384,466,867.81**
11	**විවිධ ණයගැතියෝ, තැන්පතු හා පූර්ව ගෙවීම්**				
	අපනයන බිල්පත් වට්ටම් කිරීමේ පහසුකම මත අත්තිකාරම්			34,958,636.11	34,958,636.11
	අඩුකළා: අඩමාණ ණය සඳහා වෙන් කිරීම්			(34,958,636.11)	(34,958,636.11)
				-	-
	කාර්ය මණ්ඩල ණය හා පොදු අත්තිකාරම්			2,973,249.77	2,671,468.28
	විවිධ තැන්පතු			108,837.50	108,837.50
	නැවත ආපසු ලබාදෙන තැන්පතු			406,500.00	406,500.00
	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සුභසාධන සංගමය වෙත ලබාදුන් ණය			500,000.00	500,000.00
	වැටුප් සහ ජීවනා පාලන ගිණුම			(67,243.79)	30,935.25
	විවිධ ණයගැතියෝ			770.00	770.00
	පූර්ව ගෙවීම්			1,315,114.14	563,996.27
	BizInfo ලැබිය යුතු ආදායම			(6,430.80)	(6,430.80)
	නැවත ආපසු ලබාගත හැකි මූල්‍ය සේවා මත වැට් බද්ද			2,185,511.00	2,185,511.00
	නැවත ආපසු ලබාගත හැකි රඳවා ගැනීමේ බද්ද			13,203,172.35	27,586,095.84
				20,619,480.17	**34,047,683.34**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)

		ප්‍රවර්තන වර්ෂය 2024	පූර්ව වර්ෂය 2023
12	ලැබිය යුතු පොලිය		
	භාණ්ඩාගාර තැන්පතු	67,615,246.42	67,615,246.42
	භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර	6,867,551.54	1,295,539.36
	ස්ථාවර තැන්පතු (එක්සත් ජනපද ඩොලර්)	90,780,935.35	219,884,472.41
	ලැබිය යුතු පොලිය - ස්ථාවර තැන්පතු (යුරෝ)	3,530,898.32	7,428,203.88
	ස්ථාවර තැන්පතු (ශ්‍රී ලංකා රුපියල්)	110,527,472.49	136,671,397.33
		279,322,104.12	**432,894,859.40**
13	කෙටි කාලීන ආයෝජන		
	ස්ථාවර තැන්පතු (එක්සත් ජනපද ඩොලර්)	2,338,639,947.03	2,275,731,540.49
	ස්ථාවර තැන්පතු (යුරෝ)	69,841,971.94	74,691,306.25
	ස්ථාවර තැන්පතු (ශ්‍රී ලංකා රුපියල්)	2,442,867,079.16	1,995,433,571.29
	පාරිතෝෂික ඉතිරුම් ගිණුම	150,983.26	143,722.88
	පාරිතෝෂික ඉතිරුම් මත භාණ්ඩාගාර බිල්පත්	15,529,259.54	12,880,628.00
	රජයේ භාණ්ඩාගාර බිල්පත්	181,318,852.43	163,500,000.00
	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ තැන්පතු	696,064.85	673,646.74
		5,049,044,158.21	**4,523,054,415.65**
14	විදේශ ව්‍යවහාර මුදල් ඉතිරුම් ගිණුම		
	ලංකා බැංකුව - එක්සත් ජනපද ඩොලර් ගිණුම	4,516,127.77	4,931,537.43
	මහජන බැංකුව - එක්සත් ජනපද ඩොලර් ගිණුම	4,509,654.79	4,897,245.54
	ඉතිරුම් ගිණුම (යුරෝ මුදල් ඒකකවලින්)	44,657.41	52,600.30
		9,070,439.97	**9,881,383.27**
	<u>විදේශ ව්‍යවහාර මුදල් වලින්</u>		
	ලංකා බැංකුව - එක්සත් ජනපද ඩොලර් ගිණුම	15,663.09	15,451.13
	මහජන බැංකුව - එක්සත් ජනපද ඩොලර් ගිණුම	15,640.64	15,343.69
	ඉතිරුම් ගිණුම (යුරෝ මුදල් ඒකකවලින්)	149.65	149.65
	<u>විනිමය අනුපාතිකය</u>		
	ලංකා බැංකුව - එක්සත් ජනපද ඩොලර් ගිණුම	288.33	319.17
	මහජන බැංකුව - එක්සත් ජනපද ඩොලර් ගිණුම	288.33	319.17
	ඉතිරුම් ගිණුම (යුරෝ මුදල් ඒකකවලින්)	298.41	351.48
15	මුදල් හා මුදල් සමාන දෑ		
	බැංකුවේ ඇති මුදල්		
	හැටන් නැෂනල් බැංකුවේ ජංගම ගිණුම්	11,557,102.74	955,761.17
	හැටන් නැෂනල් බැංකුවේ හර බද්දෙන් නිදහස් ජංගම ගිණුම	1,468,525.96	605,801.67
	හැටන් නැෂනල් බැංකුවේ ඒක්ෂණ තැන්පතු ගිණුම	13,428,928.39	13,428,928.39
	ලංකා බැංකුවේ ජංගම ගිණුම	8,254,922.99	1,325,877.13
	මහජන බැංකුවේ ජංගම ගිණුම	1,611,525.36	113,831.01
	ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරුම් ගිණුම	5,554.63	-
		36,326,560.07	**16,430,199.37**
	අතැති මුදල්	2,000.00	2,000.00
		36,328,560.07	**16,432,199.37**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව			
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන			
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්		ප්‍රවර්තන වර්ෂය	පූර්ව වර්ෂය
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)		2024	2023
සටහන			
16	**ගෙවිය යුතු පාරිතෝෂික**		
	ඉදිරියට ගෙනා ශේෂය	13,466,484.40	30,010,488.00
	වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම්	3,352,124.08	2,401,583.33
	ඌන/අධි වෙන්කිරීම් සඳහා ගැලපුම්	771,330.00	(16,376,815.93)
		17,589,938.48	16,035,255.40
	වර්ෂය තුළ ගෙවීම්	(4,976,040.00)	(2,568,771.00)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**12,613,898.48**	**13,466,484.40**
17	**විවිධ ණය හිමියෝ, උපචිත වියදම් හා ප්‍රතිපාදන වෙන් කිරීම**		
	විවිධ ණය හිමියෝ		
	සංචිත වැට් බද්ද (ඔප්පු වාරිකයෙන් අයකරන ලද)	1,906,902.00	1,906,902.00
	කාර්ය මණ්ඩල වෛද්‍ය අරමුදල	883,758.00	724,038.00
	පාරිභෝගිකයන්ගෙන් රඳවාගන්නා ආපසු ගෙවනු ලබන තැන්පතු	1,846,800.00	2,025,300.00
	උපචිත වියදම්		
	සේවක අර්ථසාධක අරමුදල	(309,862.55)	(309,861.96)
	සේවක භාරකාර අරමුදල	(49,063.78)	32,783.51
	මුද්දර ගාස්තු	17,750.00	6,925.00
	අපොහුත් ගෙවිය යුතු	14,268,043.77	21,739,550.66
	තත්ත්ව වාර්තා සඳහා ගාස්තු	1,983,730.46	-
	තත්ත්ව වාර්තා සඳහා ගෙවිය යුතු බදු දේපණ	250,000.00	-
	උපචිත	6,121,137.39	8,621,280.00
	ප්‍රතිපාදන වෙන් කිරීම		
	ගෙවිය යුතු විගණන ගාස්තු	4,214,436.43	1,287,118.00
	ගෙවිය යුතු ආදායම් බදු	213,934,361.11	267,576,715.48
	මූල්‍ය සේවා මත වැට් බද්ද	48,193,771.16	48,193,771.16
	වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමේ ගාස්තු	275,000.00	1,485,540.00
	ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	-	8,325,754.55
	ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද	150,163.99	131,761.93
	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ සුභසාධන සංගමය	-	5,150.00
	භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බද්ද	322,839,861.24	300,000,000.00
		616,526,789.22	**661,752,728.33**
18	**ඉදිරියේ දී ගෙවිය යුතු හිමිකම් සඳහා වෙන්කිරීම**		
	ජනවාරි 1 දිනට ශේෂය	455,871,582.86	454,601,351.49
	වර්ෂය තුළ ගෙවූ හිමිකම්	(26,958,060.95)	(40,574,275.29)
	2023 වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ හිමිකම්	428,913,521.91	414,027,076.20
	වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්	112,989,079.26	103,780,022.24
	ගැලපුම්	(309,020,543.85)	-
	දෙසැම්බර් 31 වැනි දිනට ඉතිරි ප්‍රතිපාදන	**232,882,057.32**	**517,807,098.44**
	හිමිකම්සඳහා වෙන්කළ මුළු ප්‍රතිපාදනය	**232,882,057.32**	**517,807,098.44**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින්)

සටහන

19 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ අනාවරණය කිරීම

- ප්‍රත්‍යාගණනය බලාත්මක වන දිනය

ගොඩනැගිලි	01-Jan-18
මෝටර් වාහන	31-Dec-21
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	31-Dec-16
කාර්යාල උපකරණ	31-Dec-16
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	31-Dec-16

- තක්සේරු කිරීම් සිදුකරන ලද්දේ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසිනි.
- පරීක්ෂා කිරීමෙන් හා නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව වටිනාකම කෙරෙහි බලපාන අදාළ සියලුම සාධක සැලකිල්ලට ගෙන හැකිතාක් නිරවද්‍ය ආකාරයට තක්සේරුව සිදුකර තිබේ.
- ප්‍රත්‍යාගණනය මගින් පැමිණි අගය යනු වත්කම්වල වෙළඳපොළ වටිනාකම යි.
- පිරිවැය ආකෘතිය යටතේ ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ධාරණ අගය සැලකේ.

ගොඩනැගිලි	132,375,000.00
මෝටර් වාහන	17,328,000.00
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	-
කාර්යාල උපකරණ	-
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	567,148.24
මෘදුකාංග	775,431.29

20 අවිනිශ්චිත වගකීම්

(අ) සංස්ථාවට එරෙහිව ගොනුකර ඇති නඩු

1 ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට එරෙහිව ට්‍රොපිකල් ෆිෂරි (ප්‍රයිවට්) ලිමිටඩ්; CHC 47/2020/MR
මෙම නඩුව පවරා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ සූරියා එල්එල්සි වෙත ගෙවීමක කොටසක් සිදුකර තිබීමෙන් වන රු.මිලියන 27.5 ක හිමිකමක් ඉල්ලා ඇත.

(ආ) 2024 දෙසැම්බර් 31 වන දිනට සංස්ථාව විසින් දරන මූළු වගකීම්

- වලංගුව පවතින අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු
- වලංගුව පවතින ණය ඇපකර
- උපරිම වගකීම්

21 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

නම	තනතුර	ආශ්‍රිත පාර්ශව ගනුදෙනුවේ ස්වභාවය	ලිපිනය
මහාචාර්ය (ආචාර්ය) අරුණ ශාන්ත	සභාපති	නොමැත (2024 ඔක්තෝබර් 28 සිට)	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව,# 42, 4 වැනි මහල, NDB-EDB කුළුණ ,කොළඹ 02
එස්.සී.ජේ.දේවේන්ද්‍ර මයා	සභාපති	නොමැත (2024 ඔක්තෝබර් 10 වැනි දින ඉල්ලා අස්වී ඇත)	
ඒ.ඒ.අයි.දිල්රුක්ෂි මෙය	අධ්‍යක්ෂ	නොමැත (2024 නොවැම්බර් 30 වැනි දින ඉල්ලා අස්වී ඇත)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව , මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ලේකම් කාර්යාලය, කොළඹ 01
අරවින්දි ද සිල්වා මිය	අධ්‍යක්ෂ	නොමැත	වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය, නො.492, ආර්.ඒ ද මෙල් මාවත, කොළඹ
ඒ.ඒ.එම්.තසීම් මයා	අධ්‍යක්ෂ	නොමැත (2024 සැප්තැම්බර් 30 වැනි දින ඉල්ලා අස්වී ඇත)	ශ්‍රී ලංකා මහ බැංකුව , නො.30, ජනාධිපති මාවත, කොළඹ 01
ප්‍රියන්ත පෙරේරා මයා	අධ්‍යක්ෂ	නොමැත	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, නො.21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02
බී.එම්.එස්.බණ්ඩාර මෙය	අධ්‍යක්ෂ	නොමැත (2024 ජූනි 30 වැනි දින ඉල්ලා අස්වී	වෙළඳ අමාත්‍යාංශය , එල්එච්පී ගොඩනැගිල්ල, 492, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

22 හිමිකම් සඳහා වන අවිනිශ්චිත ප්‍රතිපාදන අනාවරණය කිරීම 2024

	EPIP	PSCG	PCG	EPG	CPA	එකතුව
2024 ජනවාරි 01 දිනට ශේෂය	49,326,397	54,000	23,437	43,620	13,384,293	62,831,747
වර්ෂය තුළ ගෙවන ලද හිමිකම්	26,958,061	-	-	-	-	26,958,061
	22,368,336	54,000	23,437	43,620	13,384,293	35,873,686
2024 වර්ෂයේ හිමිකම් ගෙවීම සඳහා අවිනිශ්චිත ප්‍රතිපාද	31,159,476	(54,000)	275	20,060	30,465,266	61,591,077
2024 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	**53,527,812**	-	**23,712**	**63,680**	**43,849,559**	**97,464,763**

	වාරික 2024	ප්‍රතිපාදනය %	2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන	
පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකර	-	12%	-	EPIP
				PSCG
පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකර	474,242	5%	23,712	PCG
				EPG
අපනයන කාර්යසාධන ඇපකර	3,184,000	2%	63,680	CPA
				Contigency Provision
අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු	356,852,082	15%	53,527,812	
			53,615,204	

CPA

	2022	2023	2024	
CPA වාරික	13,317,727	79,993,105	234,562,411	
හිමිකම් ගෙවීම් සඳහා ප්‍රතිපාදන %	5%	10%	15%	
හිමිකම් ගෙවීම් සඳහා ප්‍රතිපාදන	665,886	7,999,311	35,184,362	
එකතුව			43,849,559	43,849,559
2024 වර්ෂය සඳහා වූ අවිනිශ්චිත ප්‍රතිපාදන				97,464,763

2024 වර්ෂය සඳහා වන හිමිකම් භාණ්ඩ

	නිශ්චිත ප්‍රතිපාදන	අවිනිශ්චිත ප්‍රතිපාදන	එකතුව
EPIP හිමිකම්	108,068,827	31,159,476	139,228,303
PSCG හිමිකම්	-	(54,000)	(54,000)
PCG හිමිකම්	-	275	275
EPG හිමිකම්	-	20,060	20,060
CPA හිමිකම්	-	30,465,266	30,465,266
2024 වර්ෂය සඳහා වූ හිමිකම්	**108,068,827**	**61,591,077**	**169,659,904**

23 ලැබිය යුතු මුදල් පිළිබඳ අනාවරණය

· අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම විසින් රු. 67, 615,246.42 ක භාණ්ඩාගාර තැන්පතුවක් සම්බන්ධයෙන් වෙන්හාරික විගණනයක් සිදුකර ගෙනයමින් පවතී. සිය ගිණුම් වාර්තාවල ද එවැනි තැන්පතුවක් පිළිබඳව වාර්තා නොවනබව භාණ්ඩාගාරය විසින් තහවුරු කරන ලදී. වෙන්හාරික විගණක වාර්තාව ලැබීමෙන් පසුව සංස්ථාව විසින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ලැබේ.

· අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගම විසින් රු. 34,958,636.11 ක වටිනාකමකට අපනයන බිල්පත් වට්ටම් පහසුව යටතේ ලබා දී ඇති අත්තිකාරතම සම්බන්ධයෙන් වෙන්හාරික විගණනයක් සිදුකර ගෙනයමින් පවතී. වෙන්හාරික විගණක වාර්තාව ලැබීමෙන් පසුව සංස්ථාව විසින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ලැබේ.

24 පූර්ව වර්ෂ ගැලපුම්

වැරදි ආකාරයෙන් සිදුකර තිබූ ගිණුම්ගතකිරීම නිවැරදි කිරීම	(6,490,894)
පූර්ව වර්ෂය සඳහා ගැලපුම්	(4,796,780)
වියදම් සඳහා අධි වෙන්කිරීම	305,787,458
විනිශ්චිත අරමුදල් ආපසු හැරවීම	65,296,751
පොලිය සහ කාර්ය මණ්ඩල අඩකිරීම්වල නිවැරදි කිරීම	59,240
පාරිතෝෂිකය සඳහා ගැලපුම්	(261,329)
පාරිතෝෂිකඅරමුදල සඳහා ගැලපුම්	1,440,311
පාරිභෝගිකශේෂය නිවැරදි කිරීම	(119,000)
ප්‍රතිපාදනවලආපසුහැරවීම	16,947,035
	377,862,792

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදු තොරතුරු
1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ස්ථාපනය කර ඇති අතර, 1979 පෙබරවාරි 08 වැනි දින සිට වාණිජ මෙහෙයුම් ආරම්භ කර තිබේ. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, නවම් මාවතේ, අංක 42 දරන ස්ථානයේ NDB-EDB කුළුනෙහි 4 වැනි මහලේ පිහිටා තිබේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය
මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

පිළියෙළ කිරීමේ පදනම

- ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය වාණිජ සහ දේශපාලනික හේතූන් මත විදේශීය ගැනුම්කරුවන් විසින් අපනයන සඳහා නොගෙවීමේ අවදානම ආවරණය කරමින් අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම සහ අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන ව්‍යාපාරවල අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා ලිහිල් සීමා යටතේ මුදල් ලබාදීමට පහසුකම් සැලසීම සඳහා බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට ඇපකර නිකුත් කිරීම ඔස්සේ අපනයන වෙළඳාමේ අවදානම දැරීම සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

- මිනුම්කරණ පදනම
  2023 දෙසැම්බර් 31 වැනි දිනට සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමඟ ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබේ. ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශ සඳහා බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් කිරීමකින් තොරව අඛණ්ඩව යොදා ගෙන තිබේ.

- ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය
  මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (LKAS) අනුකූල වන අතර ඒ සඳහා ප්‍රතිපත්ති යොදාගැනීම සහ වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තාගත අගයන් මත බලපාන තීන්දු ගැනීම, ඇස්තමේන්තු කිරීම් හා උපකල්පනයන් කළමනාකාරිත්වය විසින් සිදුකළ යුත්තේ ය. අවස්ථානුගතව සාධාරණයැයි හැඟෙන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන පදනම් වන අතර, වෙනත් මූලාශ්‍රවලින් පහසුවෙන් දෘශ්‍යමාන නොවන වත්කම් සහ වගකීම්වල ධාරණ අගය නිශ්චය කිරීම සඳහා පදනමක් එමඟින් සැපයේ. ඇස්තමේන්තු සහ ඊට පාදක උපකල්පන කෙරීගෙන යන පදනමින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන, අදාළ සංශෝධනය එය සිදුකරන කාලසීමාවට පමණක් බලපානු ලබන්නේ නම් එම කාල සීමාව තුළ හඳුනා ගැනීම හෝ අදාළ සංශෝධනය ප්‍රවර්තන හා අනාගත කාල සීමා දෙකම සඳහා බලපානු ලබන්නේ නම්, අදාළ සංශෝධනය එම කාල සීමාව සහ අනාගත කාල සීමා සඳහා හඳුනාගැනීම සිදුකෙරේ.

- අඛණ්ඩ පැවැත්ම
  මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, නුදුරු අනාගතයේ දී අඛණ්ඩව පැවතීම සම්බන්ධයෙන් ආයතනයේ හැකියාව සම්බන්ධයෙන් තක්සේරුවක් සිදුකරනු ලැබේ. අනාගතය සම්බන්ධයෙන් ලබාගත හැකි සියලු තොරතුරු සැලකිල්ලට ගැනීමේ දී ආයතනය ඇවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීම සඳහා අවශ්‍යතාවයක් අප විසින් දකිනු නොලැබේ.

සංසන්දනාත්මක තොරතුරු
සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුරූපී ආකාරයෙන් යොදාගන්නා අතර පෙර වර්ෂයේ දී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුරූප වේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති
මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරෙන සියලුම කාල පරිච්ඡේද සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුරූපී ආකාරයෙන් යොදා ගෙන ඇති අතර, සංස්ථාව විසින් අනුරූපී ආකාරයෙන් යොදා ගනු ලැබේ.

- **විදේශ ව්‍යවහාර මුදල් ඒකක වලින් සිදුකරන ගනුදෙනු**
  මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අයිතම ශ්‍රී ලංකා රුපියල්වලින් (LKR) මිනුකරණය කර තිබේ. විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් සිදුකරන ගනුදෙනු එකී ගනුදෙනු සිදුවෙන දිනවල පවත්නා විනිමය අනුපාතික භාවිතා කරමින් වාර්තාකරණ මුදල් ඒකකයට පරිවර්තනය කර තිබේ. එවැනි ගනුදෙනු පියවීමේ දී ප්‍රතිඵල වන්නා වූ විදේශ විනිමය අනුපාතික ලැබීම්/ පාඩු ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ. ශේෂ පත්‍ර දිනයට විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් නාමනය වන්නා වූ මුදල් වත්කම් සහ වගකීම්, එකී දිනයේ දී පවතින විනිමය අනුපාතික ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් නාමනය වන්නා වූ මුදල් වත්කම් සහ වගකීම් පරිවර්තනය කිරීමේ දී ප්‍රතිඵල වන්නා වූ විදේශ විනිමය අනුපාතික ලැබීම්/ පාඩු, ගිණුම්කරණ ප්‍රමිත LKAS 21 අනුකූලව 2018 මූල්‍ය වර්ෂයේ සිට බලාත්මක වන පරිදි ලාභ සහ පාඩු ගිණුමේ හඳුනාගනී. 2018 වර්ෂයට පූර්වයෙන්, වෙන්ව පැවති විදේශ ව්‍යවහාර මුදල් ඒකක සමාකරණ සංචිතයක් තුළින් ශුද්ධ විදේශ විනිමය අනුපාතික ලැබීම්/ පාඩු හඳුනාගනු ලැබූ අතර, එය 2018 වර්ෂයේ සිට බලාත්මකවීම අවසන්කරන ලදී.

දේපළ, පිරියත සහ උපකරණ
හඳුනාගැනීම සහ මිනුම්කරණය

- දේපළ, පිරියත සහ උපකරණවල සමුච්චිත ක්ෂයකිරීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර පිරිවැය/ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම මත සටහන් කෙරේ. මෙම පිරිවැයට වත්කම අත්පත් කරගැනීම සඳහා ඍජුවම අදාළ කරගත යුතු වියදම් ඇතුළත් වේ. ස්වයං- නිර්මිත වත්කම්වල පිරිවැයට එය සෑදීම සඳහා යොදාගත් ද්‍රව්‍යවල පිරිවැය, ඍජු ශ්‍රමය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වන ක්‍රියාකාරී තත්ත්වයට රැගෙන ඒම සඳහා ඍජුවම අදාළ වන වෙනත් පිරිවැය, සහ එම අයිතම කොටස්වලට වෙන්කර ඉවත් කිරීම සහ ඒවා ස්ථානගත කළ ස්ථානය යථා තත්ත්වයට පත්කිරීමේ පිරිවැය ද ඇතුළත් වේ. යම් දේපළක්, පිරියතක් සහ උපකරණයක් වෙනස් ආයු කාල සහිත ප්‍රධාන සංරචකවලින් සමන්විත වේ නම්, ඒවා වෙන් වෙන් දේපළ, පිරියත සහ උපකරණ අයිතම ලෙස ගිණුම්ගත කෙරේ.

- දේපළ, පිරියත සහ උපකරණ අයිතම බැහැර කිරීමෙන් ලබන ලාභ හෝ පාඩු නිර්ණය කරනුයේ බැහැර කිරීමෙන් ලබන ආදායම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර, එය ආදායම් ප්‍රකාශයේ "ශුද්ධ වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනාගනී.

ක්ෂය කිරීම
සින්නක්කර ඉඩම් හැරුන විට සියලුම දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය මුළුල්ලේ ඒවායෙහි ශේෂ අගයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පැවරීම සඳහා සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂය කිරීම් සඳහා වෙන් කිරීම් ගණනය කෙරේ. මිලදී ගනු ලබන වර්ෂයේ දී පූර්ණ වශයෙන් ක්ෂය කරනු ලබන අතර ඉවත් කරන වර්ෂයේ දී ක්ෂය කිරීම් ගණනය කරනු නොලැබේ.

වාර්ෂික ක්ෂය කිරීම් අනුපාතික පහත පරිදි වේ.

1. ගොඩනැගිලි	5%	වසර 20
2. කාර්යාල උපකරණ	25%	වසර 04
3. මෝටර් වාහන	20%	වසර 05
4. මෘදුකාංග සහ පරිගණක	25%	වසර 04
5. ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	10%	වසර 10

මෙම වත්කම්වලට අදාළව නාමික ඓතිහාසික පිරිවැය ක්ෂය යටතේ ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත අය කෙරෙන වාර්ෂික ක්ෂය කිරීම්හි අතිරික්තයට සමාන වන වටිනාකමක් වර්ෂිකව ප්‍රත්‍යාගණනිත අතිරික්තයේ සිට උපචිත පොළිය වෙත මාරු කෙරේ. වත්කමෙහි ධාරණ අගය, එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩිවිට එහි අයකර ගතහැකි වටිනාකම දක්වා වහාම ලියා හරිනු ලැබේ.

බැහැර කිරීම්
බැහැර කිරීම්හි ලාභ සහ පාඩු එයින් ලැබූ ආදායම ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමෙන් නිර්ණය කරන අතර, ආදායම් ප්‍රකාශයේ මෙහෙයුම් ලාභය හෝ පාඩුව නිර්ණය කිරීමේ දී හඳුනාගනී. ප්‍රත්‍යාගණනිත වත්කම් අලෙවි කිරීමේ දී, ප්‍රත්‍යාගණනිත සංචිතයේ ඇතුළත් අගය රඳවාගත් ඉපැයුම් වෙත මාරු කෙරේ.

හානිකරණය
හානිකරණය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය වාර්ෂිකව හෝ ධාරණ අගය අය කරගත නොහැකි බව සිද්ධි හෝ අවස්ථාවන්ගේ වෙනස්වීම මඟින් හැඟවෙන විට සමාලෝචනය කෙරේ. එවැනි හැඟවීමක් පවතින විට සහ ධාරණ අගය ඇස්තමේන්තුගත අයකරගත හැකි අගය ඉක්මවා යනවිට දී, වත්කම් ඒවායේ අය කරගත හැකි අගයට ලියා හරිනු ලැබේ. යම්කිසි වත්කමක් පූර්ව ප්‍රත්‍යාගණනිත අතිරික්තය ප්‍රතිවර්තනය නොමැති නම් හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලාභ/ පාඩු
දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ සහ ඉවත් කිරීමේ ලාභ හෝ පාඩු එම අලෙවිය සිදුකළ කාල සීමාවට අදාළව හඳුනාගන්නා අතර වෙනත් ආදායම් යටතේ වර්ගීකරණය කෙරේ.

කෙරී ගෙන යමින් පවතින ප්‍රාග්ධන කාර්යය
ශේෂපත්‍ර දිනයට සම්පූර්ණ කර නොමැති වර්ෂය තුළ වැය දරන ලද ප්‍රාග්ධන වියදම්, පූර්ව ගෙවීම් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ නිමාකර භාවිතයට යොදා ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත සහ උපකරණ යටතට මාරු කෙරේ.

අස්පෘශ්‍ය වත්කම්
සංස්ථාව විසින් අත්පත් කරගනු ලැබූ සැලකිය යුතු ඵලදායි ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්හි අගය එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකර මිනුම්කරණය කෙරේ. පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම ආශ්‍රිත පිරිවැය එය වැය කරන අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගැනේ. සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන සහ පාලනය කරන හඳුනාගත හැකි සහ සුවිශේෂී මෘදුකාංග නිෂ්පාදන සකස් කිරීම සහ පරීක්ෂා කිරීම් සඳහා සෘජුවම වැයවන සංවර්ධන පිරිවැය ද අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ.

හඳුනාගැනීමේ පදනම
අස්තිත්වය තුළට අනාගත ආර්ථික ප්‍රතිලාභයන් වත්කම තුළින් ගලා ඒම පිළිබඳව අපේක්ෂා කළ හැකිනම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක වත්කම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගන්නා අතර සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු පිරිවැයෙන් අඩුකර වාර්තා කෙරේ.

පසුකාලීන වියදම්
පසුකාලීන වියදම් හඳුනාගනු ලබන්නේ එම නිශ්චිත වත්කම් හා බැඳුනු අනාගත ප්‍රතිලාභයන් එමඟින් වැඩිවේ නම් පමණි. අභ්‍යන්තරිකව බැඳුන කීර්තිනාමය සහ සන්නාම ඇතුළු අනෙකුත් සියලු වියදම්, වැය දරන අවස්ථාවේ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

භාවිතයෙන් ඉවත් කිරීම සහ බැහැර කිරීම
අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීම හෝ එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට සහ පසුව සිදුවන බැහැර කිරීමේ අවස්ථාවේ දී ඒවා හඳුනා ගැනීම අත්හරිනු ලැබේ.

ක්‍රමක්ෂය
අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායි ජීවිත කාලය තුළ දී භාවිතය සඳහා ගතහැකි දිනයේ සිට සරල රේඛීය පදනමින් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

හානිකරණය
ස්පෘශ්‍ය වත්කම්වලට හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට ඇඟවීමක් තිබේ ද යන්න නිර්ණය කරගැනීම සඳහා සංස්ථාව විසින් එහි වත්කම්වල ධාරණ අගය සෑම ශේෂ පත්‍ර දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් පවතී නම්, වත්කමේ නැවත අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කෙරේ. වත්කමක ධාරණ අගය හෝ එහි මුදල්-උත්පාදන ඒකකය එහි නැවත අයකරගත හැකි වටිනාකම ඉක්මවා යන සෑම අවස්ථාවකදීම හානිකරණ පාඩුව හඳුනාගැනේ. හානිකරණ පාඩු ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

ආයෝජන දේපළ
දිගුකාලීන ඉපැයුම් හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ දෙකම සඳහා තබා ඇති දේපළ, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කෙරේ. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, ආයෝජන දේපළ පිරිවැයට පවත්නා ගෙන යයි.

කෙටිකාලීන ආයෝජන
දේශීය මුදල් ඒකකවලින් පවතින කෙටි කාලීන ආයෝජන කෙටි කාලීන අතිරික්ත අරමුදල් සංස්ථාව විසින් රජයේ භාණ්ඩාගාර බිල්පත්වල හෝ අනෙකුත් ස්ථිර ආදායම් ආයෝජනවල ආයෝජනය කරන අතර, ශේෂ පත්‍ර දිනයට පවතින විනිමය අනුපාතිකය මත අගය කරන විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් නාමනය වන ස්ථිර තැන්පතු හැරුන විට ඒවා පිරිවැය මත ගිණුම්ගත කෙරේ. මෙම ආයෝජන මත උපචිත වන පොළිය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

විදේශීය මුදල් ඒකකවලින් පවතින කෙටි කාලීන ආයෝජන
විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් ලබාදිය යුතු අනාගත හිමිකම් බැඳීම් සපුරාලීම සඳහා අවශ්‍ය කරන අරමුදල් වෙන්කර තබන අතර පොළිය එකතුවන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල තැන්පත් කරනු ලැබේ. ඒ සඳහා උපචිත වන පොළිය, ගනුදෙනුව සිදුවන දිනයේ පවතින විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී. මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ආයෝජන වටිනාකම් ශේෂ පත්‍ර දිනයේ පවතින විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කෙරේ.

මූල්‍ය ආයෝජන: කල්පිරීම තෙක් දරා සිටින

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථිර තැන්පතු සහ ණයකරවල රුපියල්වලින් ආයෝජනය කර ඇති කෙටි කාලීන සහ දිගු කාලීන ආයෝජන කල් පිරීම තෙක් දරා සිටින අතර පිරිවැයට ලැබිය යුතු පොලිය එකතු කර සඳහන් කෙරේ.

මූල්‍ය උපකරණවලින් පැන නඟින අවදානම්

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පතු සහ ණයකරවල සිදුකර ඇති ආයෝජනවලින් කෙටිකාලීන සහ දිගු කාලීන ආයෝජන සමන්විත වේ. ණයකර ඔස්සේ පොලී අනුපාතික අවදානම, ප්‍රති ආයෝජන අවදානම, පැහැර හැරීමේ අවදානම සහ ද්‍රවශීලතා අවදානම පවතී. කල් පිරීම දක්වා පවතින ස්ථාවර තැන්පතු සඳහා පැහැර හැරීමේ අවදානම සහ ද්‍රවශීලතා අවදානම පමණක් පවතින නමුදු දේශීය ව්‍යවහාර මුදල්වලින් පවතින ස්ථිර තැන්පතු සඳහා ආවේණික අවදානම් හැර විදේශ ව්‍යවහාර මුදල් ඒකකවලින් පවතින ස්ථාවර තැන්පතු සඳහා විනිමය අනුපාතික විචලනයන්ටද නිරාවරණය වේ. මෙම තැන්පතු රාජ්‍ය බැංකුවල පවත්වාගෙන යෑමේ වාතාවරණයක් තුළ, විදේශ විනිමය අනුපාතිකයන් විචලනය වීමේ අවදානම හැර, ඉහත සඳහන් කළ සියලුම අවදානම් අවම මට්ටමක පවතී

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු

උපලබ්ධි වියයුතු ලෙස ඇස්තමේන්තු කරන වටිනාකමට වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ දැක්වේ. වසර තුනකට වැඩි කාල සීමාවක් මුළුල්ලේ නොගෙවා ඇති බොල් ණය සහ අඩමාන ණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීම් සිදුකර තිබේ.

තොග

ලිපිද්‍රව්‍ය තොග සහ පාරිභෝජන අයිතමවලින් තොග සමන්විත වේ. පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොගවල වටිනාකම මිනුම්කරණය වේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ දී තොග විකිණිය හැකි මිල වේ.

මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් වශයෙන් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යයන් සඳහා පහසුවෙන් දන්නා මුදල් වටිනාකම්වලට පරිවර්තනය කළ හැකි දෑ වශයෙන් මුදල් හා මුදල් සමාන දෑ නිර්වචනය කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් සහ ගෙවීමට ඇති බැංකු අයිරා, කෙටි කාලීන ණය ගැනුම් සහ කෙටි කාලීන ආයෝජනවල ශුද්ධ වටිනාකමෙනි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LAKAS) 07- මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශ වක්‍ර ක්‍රමය යටතේ පිළියෙල කෙරේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ, සේවකයෙකු සඳහා වගකීමක් පැන නඟිනුයේ වසර එකක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළහොත් පමණි. මෙම බැඳීම බාහිර වශයෙන් මූල්‍යායනය නොකෙරේ.

සේවක ප්‍රතිලාභ

නිශ්චිත ප්‍ර.තිලාභ සැලසුම් - විශ්‍රාමික පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා සංස්ථාවේ ශුද්ධ වගකීම සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපාදන නිර්ණය කිරීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් ගණනය කෙරේ. මෙම ගණනය කිරීම වසර තුනකට වරක් සුදුසුකම්ලත් ස්වාධීන ආයුගණකවරු විසින් සිදු කෙරේ. මිනුම්කරණය කළ ආයුගණක ලාභ/ අලාභ අන්තර්ගත ශුද්ධ ප්‍රතිලාභ වගකීම ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ වහාම හඳුනාගැනේ.

නිශ්චිත දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල (E P F) සහ සේවක භාරකාර අරමුදල (E T F) මීට ඇතුළත් වේ. අදාළ ආඥා පනත් සහ රෙගුලාසි වලට අනුකූලව එම අරමුදල්වලට දායකත්වය දැරීම සඳහා සේවකයන් සුදුසුකම් ලබයි.

වගකීම් සහ ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් පැන නැඟුන වර්තමාන නෛතික/ ගිවිසුම්ගත බැඳීමක් තිබේ නම් වගකීම් සහ ප්‍රතිපාදන ශේෂ පත්‍රයේ හඳුනා ගන්නා අතර එවිට සමූහයේ ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් පිටතට ගලා යාමක් අපේක්ෂා කෙරේ. ණය හිමියකු විසින් ඉල්ලුම් කළ විට හෝ ශේෂ පත්‍ර දිනයෙන් වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍ර දිනයේ සිට වසරකින් පසු ගෙවිය යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් ලෙස සැලකේ.

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පිරිවැය මත සඳහන් කෙරේ.

හිමිකම් සඳහා අවිනිශ්චිත ප්‍රතිපාදන

අපගේ අතීත අත්දැකීම් අනුව මෙරටින් බැහැර වීමේ පිරිවැය ආවරණය කරමින් ලබාදෙන බැංකු ඇපකර සඳහා හිමිකම් ගෙවීමේ අනුපාතිකය, ලැබී ඇති රක්ෂණ වාරිකවලින් 30%ක වැනි පරාසයක පවතී. රක්ෂණ වාරික ලැබීමේ දින සිට වසර තුනක කාල සීමාවක් මුළුල්ලේ විහිදී යන වාරික සඳහා හිමිකම් වගකීමක් පවතී. එම අතීත අත්දැකීම් අනුව, මෙරටින් බැහැර වීමේ පිරිවැය ආවරණය කරමින් ලබාදෙන බැංකු ඇපකර සඳහා පිළිවෙලින් 15%, 10% සහ 5% යන අනුපාතිකවලින් වසර තුනක් කාලසීමාවක් සඳහා ලැබී ඇති රක්ෂණ වාරිකවලින් 30%ක් දක්වා වූ වෙන් කිරීමක් අවිනිශ්චිත හිමිකම් සඳහා ප්‍රතිපාදන වශයෙන් සැපයේ.වසර අවසානයේ පිළිඹිබුවන ශේෂ සමඟ අනුකූලවීම සඳහා සෑම වසරකදීම ප්‍රතිපාදනය සඳහා ගැලපුම් සිදුකළ හැකි ය. අනෙකුත් රක්ෂණ වර්ග සඳහා ප්‍රතිපාදන සැලසීම පහත පදනමින් සිදුකර තිබේ.

විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව	15%
ATA Carnet System ඔස්සේ ආවරණය කෙරෙන සෘජු අපනයන කාර්යසාධන ඇපකරය	2%
පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකරය	12%
පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකරය	5%

අනෙකුත් නිමැවුම් සඳහා ප්‍රතිපාදන සැලසීම පහත ආකාරයට සිදු කෙරේ.

වාර්තාකරන ලද හිමිකම් සඳහා ප්‍රතිපාදන

මෙම ප්‍රතිපාදන වෙන් කිරීමේ දී වාර්තා කරන ලද හිමිකම් හඳුනාගෙන ඒවා සැලකිල්ට ගනී. සාධාරණ යැයි හැඟේ නම්, ශේෂ පත්‍ර දිනයට පවත්නා තත්ත්වයන් මත හිමිකම් සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් වෙන් කෙරේ. හිමිකමක් සිදුකළ යුතු බවට සම්භාවිතාවයක් පවතින බවට සාක්ෂි සහ සහතික කිරීම් පවතී. හිමිකම් ගෙවීම් ඉන් අනතුරුව වෙන්කරන ලද ප්‍රතිපාදනවලට හිලව් කෙරේ. හිමිකම් සඳහා වන වගකිම්වලට භාව්‍ය සිදුවීම් හටගැනීම මත අඛණ්ඩව ප්‍රතිපාදන වෙන් කිරීම පදනම් වේ.

ඉතිරිව ඇති අවදානම් මත නොඉපයූ වාරික සඳහා සංචිතය

සමාලෝචිත වර්ෂය තුළ දී ලියාපදිංචි සහ ලැබූ වාරික සහ එසේ රැස්කරන ලද වාරික මත ඉතිරිව ඇති අවදානම ආවරණ කාලසීමාව පුරා පැතිර යන අතර, එහිදී වාරිකයෙන් කොටසක් ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ද අදාළ වේ. රක්ෂණ ව්‍යාපාරයේ සම්මතයන්ට අනුකූලව, ප්‍රවර්තන මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් අනතුරුව ආවරණ කාල සීමාව සඳහා වාරිකය සමානුපාතිකව වෙන් කිරීම මඟින් සංචිතයක් ගොඩ නැංවේ. සංචිතය නිර්ණය කිරීම සඳහා 1/365 ක්‍රමවේදය යොදාගන්නා ලදී.

අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු මත වාරික වාරික රැස්කිරීමේ දී, ඉතිරිව ඇති අවදානම මත සංචිතයේ තත්‍ය ආවරණය සැලකිල්ලට ගනී. ආවරණ කාල සීමාව ආශ්‍රිතව පවතින අවදානම්වල සංකීර්ණබව, ස්වභාවය සහ ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඉතිරිව ඇති අවදානම සඳහා සංචිතයක් වශයෙන් ඇපකර මත එකතු කරන ලද රක්ෂණ වාරිකවලින් 15%ක් වෙන් කර තිබේ.

ආදායම

වාරික ආදායම

වසර අවසානය දක්වා භාර දී ඇති සියලුම ප්‍රකාශ සැලකිල්ලට ගෙන 'උපචිත පදනමින්' වාරික ආදායමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලැබේ. ගිවිසුම්වලින් එක් එක් පුද්ගලයන් සඳහා බලපාන කොන්දේසි මත පදනම්ව අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම වෙනස් වේ. යොදා ගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ දි යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුරූප වේ.

අනෙකුත් මෙහෙයුම් ආදායම්

දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභ සහ පාඩු

දේපළ, පිරියත සහ උපකරණ භාවිතයෙන් ඉවත් කිරීම හෝ බැහැර කිරීම ඔස්සේ ලාභ හෝ පාඩු, එකී විකිණීම් සිදුකරන කාලසීමාව තුළම හඳුනාගන්නා අතර අනෙකුත් මෙහෙයුම් ආදායම් ලෙස වර්ගීකරණය කෙරේ.

වියදම් හඳුනාගැනීම

ආදායම් වියදම්

ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කරන ආකාරයෙන් සංස්ථාව විසින් උපයාගත් ලාභය යනු සියලුම හඳුනාගත් වගකීම් සහ දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය කිරීම්වලට ප්‍රතිපාදන වෙන්කිරීමෙන් පසුව වේ. ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමවේදය ක්‍රියාත්මක වීම ඔස්සේ ආයතනයේ කාර්ය සාධනය සාධාරණ අයුරින් ඉදිරිපත්වන බව අධ්‍යක්ෂවරුන් විසින් දරන මතය වන බැවින් මෙම ක්‍රමවේදය අනුගමනය කරනු ලැබේ.

ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාවය වැඩි කිරීමේ කාර්යය සඳහා ස්ථිර ස්වභාවයෙන් වත්කම් ව්‍යාප්ත කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වැයකරන වියදම් ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු, ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කෙරේ.

බදුකරණය

ආදායම් බදු වියදම්

සංස්ථාවේ සමස්ත මෙහෙයුම් මත වන බදු වලින් වර්ෂය සඳහා ආදායම් බදු වියදම් සමන්විත වේ. වාර්තා කරන දිනයට බලාත්මක කර ඇති හෝ බොහෝ දුරට බලාත්මක බදු අනුපාතිකයන් උපයෝගී කරගෙන වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම මත ගෙවීමට අපේක්ෂිත බදු මුදල ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබන අතර පෙර වර්ෂයන් සඳහා ගෙවිය යුතු බදු සඳහා යම් ගැලපීමක් වේ නම් එය ද හඳුනාගනු ලැබේ. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව, බදුකරණ කාර්යය සඳහා ගැලපුම්කළ වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය මත බදුකරණයට අදාළ ප්‍රතිපාදන සිදු කෙරේ.

ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය ඒවා දැරූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම සමඟ අනුකූලවීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලැබේ.

අසම්භාව්‍ය වත්කම් හා බැඳීම්

අසම්භාව්‍ය වත්කම් හා බැඳීම් යනු සංස්ථාවේ පාලනයෙන් බැහැර වූ අවිනිශ්චිත අනාගත සංසිද්ධිවල සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කළ හැකි අතීත සංසිද්ධියකින් පැන නඟින විභව්‍ය වත්කමක් හෝ බැඳීමකි.

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවූ සියලු ප්‍රමාණාත්මක සිද්ධි අවධානයට යොමුකර අනාවරණය කර තිබූ අතර අදාළ පරිදි ගැලපුම් සිදුකරන ලදී.